# නියමුවා

ISSN 1391 - 1031 | 2026 ඔක්තෝබර් | 30 වෙළුම | 05 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=


# අපි ජනතා බලය විශ්වාස කරන ආණ්ඩුවක්

## ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා

බලය ඇත්තේ විධායක ජනාධිපති ධුරයේ හෝ පාර්ලිමේන්තුවේ හෝ නගර සභා, ප්‍රාදේශීය සභා තුළ නොවන බවත් ආණ්ඩුවක බලය රඳා පවතින්නේ ඒ ආණ්ඩුව සමග ජනතාව කොපමණ රැඳී සිටිනවද කියන සාධකය මත බවත් පෙන්වා දුන් ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා, වත්මන් ආණ්ඩුව ජනතාවගේ බලය විශ්වාස කරන ආණ්ඩුවක් බවත් ජනතාවගේ බලය තිබෙන තෙක් කිසිවෙකුටත් ආණ්ඩුව සෙලවීමට හෝ නොහැකි බවත් අවධාරණය කළේය.

ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 27වැනි දින 'අපේ ආණ්ඩුව' - 'වසර දෙකයි - රටට සුබයි' තේමාව යටතේ ගම්පහ නගරයේදී පවත්වන ලද ජන රැලිය අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

අපි මේ රටේ ජනතාව කෙරෙහි විශ්වාස තබා තිබෙනවා. මේ ආණ්ඩුව හැදුවේ ජනතාව. මීට කලින් ආණ්ඩු හැදෙනවා ඒගොල්ලන්ට ඉතිහාසගත පවුල් බලයක් තියෙනවා. ඒ වගේම මාධ්‍ය බලය විසින් තව ආණ්ඩු හැදුවා. ඒ වගේම මුදල් බලයෙන් නායකයෝ හැදුවා. තව අය මැර බලය යොදාගෙන ඡන්දය ගත්තා. හැබැයි ලංකාවේ පළමු වතාවට ඒ කිසිවක් නැතිව ජනතාවගේ බලය මත හැදුණු ආණ්ඩුව වන්නේ ජාතික ජනබලවේගයේ ආණ්ඩුවයි.

එසේ නම් අපේ කාර්ය වන්නේ ආණ්ඩුව කරන ගමන්ම ශක්තිමත්ව ජනතාව සමග දේශපාලනය කිරීමයි. ඡන්ද අත ළග නැහැ, අභියෝගයක් නැහැ. එහෙත් ජාතික ජනබලවේගය ශක්තිමත්ම මහජන ව්‍යාපාරය ලෙස තව තවත් වර්ධනය කිරීමට අපි කටයුතු කරනවා. මේ පාලනය රැඳි පවතින්නේ ජනතාවගේ බලය තව තවත් ශක්තිමත් කිරීමෙන් බව අපි විශ්වාස කරනවා. ඒ නිසා මේ ආණ්ඩුව කරන ගමන්, මේ ආණ්ඩුවේ ඉතිරි කාලය පුරාවටම අපි මෙලෙස ජනතාව හමුවී දේශපාලනය කතා කළ යුතුයි. අපේ මේ ව්‍යාපාරය ගොඩනැගුවෙත් එහෙමයි. අනිත් අය මැතිවරණ කාලයට විතරක් නැගිටිනකොට අපි ඡන්දයට කලින් නැගිටපු පිරිසක්. ඒ නිසා මහජන බලය සහ මහජනයා ඒකරාශි කිරීම තමයි අපේ ශක්තිය. ඒ නිසා අපේ ශක්තිය තිබෙන්නේ අද මේ ඒකරාශී වී සිටින ඔබ සතුවයි.

ලංකා ඉතිහාසයේ පළමු වතාවට දේශපාලන අධිකාරියේ ඉහළ යාන්ත්‍රණය ජනතාවගේ මුදල් සතයක්වත් හොරකම් කරන්නේ නැති ආණ්ඩුවක් නිර්මාණය වී තිබෙනවා. අපිට ඡන්දය ලබා දෙන විට ජනතාව එය සියයට සීයක් විශ්වාස කළා. ඇත්තටම ඒක ඡන්දය නොදුන් අයත් විශ්වාස කළා. ඒ නිසා මහජනතාවගේ මුදල් හොරකම් කරන්නේ නැති ආණ්ඩුවක් කියන එක අපි පසුගිය වසර දෙක තුළ ඔප්පු කර තිබෙනවා.

ඒ වගේම අපේ රටේ දේශපාලන සංස්කෘතියේ වෙනසක් අවශ්‍ය වී තිබුණා. මේ පැරණි ගරා වැටුණු දේශපාලන සංස්කෘතිය වෙනුවට අලුත් දේශපාලන සංස්කෘතියක් හදයි කියලා ජනතාව විශ්වාස කළා. අපි එය ඉටු කළා. පාලකයා සහ ජනතාව අතර නව දේශපාලන සබඳතාවක් අවශ්‍යයි. රටවල් දියුණු වීමට නම් පාලකයා සහ ජනතාව අතර නිදහස් සබඳතාවක් තිබිය යුතුයි. දැන් ඒ නිදහස් සබඳතාව තිබෙනවා. අපි අවුරුදු දෙකක් කදුළු ගෑස්, වතුර ප්‍රහාර, බැටන් ප්‍රහාර

11 පිටුවට



'අපේ ආණ්ඩුව' - ගම්පහ ජන රැලිය
2026.09.27

### 03 විසඳුම් වෙනුවෙන් එකට...

සියල්ල පරිසරය විනාශ කරමින් කළොත්, අද අපි ලබාගන්නා සංවර්ධනයේ මිල ගෙවන්න වෙන්නේ අනාගත පරපුරටයි. අද අප මුහුණ දෙන දේශගුණික විපර්යාස, වනාන්තර විනාශය, ජෛව විවිධත්වය අහිමි වීම, ජල දූෂණය, අපද්‍රව්‍ය ගැටලුව,...



### 05 ආණ්ඩුවට වසර 2යි!...

වර්තමාන ආණ්ඩුව ඉදිරියේ ඇති අභියෝගය වන්නේ රටේ භෞතික සම්පත් වැඩිකිරීම මගින් කරන භෞතික සංවර්ධනය පමණක් නොවේ. ඒ සමගම ජනතාවගේ අධ්‍යාත්මික සංවර්ධනයද සිදු කළ යුතුය. නව සංස්කෘතික මිනිසෙක් නිර්මාණය කළ යුතුය...



### 09 පාඨක සාහිත්‍ය උළෙලක්!...

සාහිත්‍ය දිනයක්, සාහිත්‍ය උළෙලක් හෝ සාහිත්‍ය මාසයක් ප්‍රකාශයට පත්කිරීම හුදෙක් කිසියම් උත්සවයක් හෝ අවස්ථාවක් සංවිධානය කිරීම යන සරල කාර්යයන්ගෙන් ඔබ්බට ගමන් කිරීම අවශ්‍යය. පාඨකයන් විසින් පොත් කියවීම නම් සන්දර්භයෙන් මිදී...




තරුණ.................................. 04
ජාත්‍යන්තර.......................... 06
ආර්ථිකය ............................ 07
කාන්තා................................ 08
විශේෂාංග........................... 10
වේදිකාව.............................. 11


යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# "22, රට, හෙට සහ ජනතා අභිලාෂය" සම්මන්ත්‍රණය කොළඹදී



"22, රට, හෙට සහ ජනතා අභිලාෂය" තේමාව යටතේ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය විසින් පසුගිය 22 දින කොළඹ මහවැලි කේන්ද්‍රයේදී සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති අමාත්‍ය ලාල්කාන්ත සහෝදරයාගේ සහ ජනාධිපති නීතිඥ නයිජල් හැච් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු මෙම අවස්ථාව සඳහා නියෝජ්‍ය අමාත්‍ය මහින්ද ජයසිංහ, නීතිඥ ජානක අධිකාරී සහෝදරවරුන් ඇතුළුව, වෘත්තිකයන් සහ රාජ්‍ය, පෞද්ගලික අංශ නියෝජනය කරමින් වෘත්තීය සමිති නියෝජිතයෝ විශාල පිරිසක් සහභාගි වූහ.

# ප්‍රවාහන සේවක සමුළුව මුළුදෙයි



'වැඩ කරමු - රට හදමු. විධිමත්, කාර්යක්ෂම ප්‍රවාහන සේවයක් ගොඩනගමු' සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමයේ 27 වන වාර්ෂික සමුළුව පසුගිය දින කොළඹ හයිඩ් පාක් පිටියේදී දහස් ගණනක් වූ සාමාජිකත්වය සහිතව පැවැත්විණි. ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති, කෘෂිකර්ම, ඉඩම්, වාරි මාර්ග හා පශු සම්පත් අමාත්‍ය ලාල් කාන්ත, ප්‍රවාහන, මහා මාර්ග නියෝජ්‍ය අමාත්‍ය ප්‍රසන්න ගුණසේන, සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමයේ ප්‍රධාන ලේකම් සේපාල ලියනගේ යන සහෝදරවරුන්ගේ ප්‍රධානත්වයෙන් මෙම සමුළුව පැවැත්වුණු අතර මෙහිදී ඉදිරි වසර සඳහා නව නිලධාරී මණ්ඩයක් පත් කර ගැනීම සිදු විය. ඒ අනුව ඉදිරි වසර සඳහා එම සංගමයේ ලේකම් ලෙස කේ. එස්. මුණසිංහ සහෝදරයාත්, සභාපති ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ධනුෂ්ක රංගනාත් සහෝදරයාත් පත්කර ගැනිණි.

# WFTU 19වැනි සමුළුවේ පූර්ව සාකච්ඡාවක් ඇතන්ස්හිදී



ලෝක වෘත්තීය සමිති සම්මේලනයේ ලේකම් මණ්ඩල හමුව පසුගියදා ග්‍රීසියේ ඇතන්ස්හි WFTU මූලස්ථානයේ පැවත්වන ලද අතර මේ හමුව සඳහා ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති නියෝජනය කරමින් අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් නීතිඥ ජානක අධිකාරී සහෝදරයා සහභාගී විය.

අන්තර් සමාගම් සේවක සංගමය හෝ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය ලේකම් මණ්ඩලය නියෝජනය නොකළද, 2027 වර්ෂයේ දී ලෝක වෘත්තීය සමිති සම්මේලනයේ 19වැනි ලෝක සමුළුව ශ්‍රී ලංකාවේ දී පවත්වනු ලබන අතර එම හේතුවෙන් එහි සංවිධාන කටයුතු පිළිබඳ මූලික පූර්ව සාකච්ඡාවක් ලේකම් මණ්ඩලය සමග කර ගැනීමේ අවශ්‍යතාවය මත මෙම හමුව සඳහා අන්තර් සමාගම් සේවක සංගමය වෙත ආරාධනා ලැබුණි. 19වැනි සමුළුව මෙවර ශ්‍රී ලංකාවේ පැවැත්වීමට සැලසුම් කර ඇති අතර එම අවස්ථාව ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරයට, වැඩකරන ජනතාවට මෙන්ම මුළු මහත් රටටම සුවිශේෂී අවස්ථාවක් වනු ඇත.

# අන්තරේ ඩොක්යාඩ්, කෝස්ට්ත්‍රෙඩ්, ලංකා ටයිල් ශාඛා සමුළු පැවැත්වේ



අන්තර් සමාගම් සේවක සංගමයේ ඩොක්යාර්ඩ් ශාඛාවේ පළමුවන මහා සභා රැස්වීම පසුගියදා සේවාමුක්ත හට සංගම් මූලස්ථානයේදී පැවැත්වණි. මේ සඳහා අන්තර් සමාගම් සේවක සංගමය ප්‍රධාන ලේකම් නීතිඥ ජානක අධිකාරී සහෝදරයා සහ ජේෂ්ඨ උපසභාපති සෝමදාස වීරතුංග සහෝදර ඇතුළු පිරිසක් සම්බන්ධ වූහ. කෝට්ස්ත්‍රේඩ් බැන්ඩ් 09 ශාඛාවේ පළමුවැනි මහා සභා රැස්වීම සඳහාද ප්‍රධාන ලේකම් නීතිඥ ජානක අධිකාරී සහෝදරයා සහ උපසභාපති කණිෂ්ක නිරෝෂන් සහෝදර ඇතුළු පිරිසක් එක්වී සිටියහ. එසේම අන්තර් සමාගම් සේවක සංගමය ලංකා ටයිල් ශාඛාවේ අභිමානවත් 18වැනි සංවත්සරික මහා සභාව එම ආයතන පරිශ්‍රයේදී පවත්වන ලද අතර මෙම මහා සභාව සඳහා ආයතනයේ සියලු සේවක සහෝදර සහෝදරියෝ සම්බන්ධ වූහ. අන්තර් සමාගම් සේවක සංගමය වෙනුවෙන් එහි ප්‍රධාන ලේකම් නීතිඥ ජානක අධිකාරී සහෝදරයා සහ ජ්‍යෙෂ්ඨ උප සභාපති සෝමදාස සහෝදරයා මේ සඳහා එක්වී සිටියහ.

# ඛනිජ තෙල් වෘත්තීය සමිති නියෝජිත හමුවක්



ලංකා ඛනිජ තෙල් පොදු සේවක සංගමයේ නිලධාරීන් නිමාව පරිශ්‍රයේ පවතින ප්‍රධාන වැඩ බිම්වලට යමින් කරන ලද සේවක හමුවක් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ නියෝජ්‍ය ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී චන්දන සූරියආරච්චි සහෝදරයා සමග එම වැඩබිම් පරිශ්‍රයේදී පැවැත්විණි. පොදු සේවක සංගමය, පාලන අධිකාරිය අතර පැවති සාකච්ඡාවලදී දීර්ඝ කාලයක් විසඳුම් නොලැබ තිබූ ප්‍රශ්නවල විසඳුම් ප්‍රමාණයක් පසුගිය දිනවල ලබාදීමට කටයුතු කර තිබූ අතර ඒ පිළිබඳව වන දැනුවත් කිරීමත්, තවදුරටත් පවතින ගැටලු හඳුනා ගැනීම හා කාර්ය මණ්ඩල, සේවකයින් ඉදිරිපත් කරන ගැටලුවලට සෘජුවම ඇහුම්කන් දීම මෙම සංචාරයේ අරමුණු අතර විය.

පසුගිය පාලන කාලයන් තුළ ඉන්ධන හා විදුලි බලශක්ති ක්ෂේත්‍රයම දැඩි අවදානමකට හා අනතුරකට හෙළා තිබුණි. තෙල් ටැංකි විකුණා දමමින්, සපුගස්කන්ද පිරිපහදුව ඇවර කරමින් රජය සතුව පැවතිය යුතු ඉන්ධන වෙළඳපොළ හැකියාව දුර්වල කරන ප්‍රතිපත්ති එදා ක්‍රියාවට නගා තිබූ නමුත් වත්මන් ආණ්ඩුව ජනතාව සතු බලශක්ති අයිතිය තහවුරු කරමින් ඉන්ධන වෙළඳපොළ සමබර කරමින් පවතී.

# මාර්ග විනය ජනාධිපති සම්මානයෙන් පිදෙයි

යුද්ධය නිසා දිනකට අහිමි වූ ජීවිත සංඛ්‍යාව අභිබවා යන අන්දමින් සිදුවන මාර්ග අනතුරු මරණ සංඛ්‍යාව අවම කර ගැනීම සඳහා නවතම ක්‍රියාමාර්ගයක් රජය විසින් සැලසුම් කරනු ලැබ ඇත.

ඒ අනුව නොවැම්බර් මස 03වැනි දිනට යෙදී තිබෙන 'මාර්ග අනතුරු වින්දිතයන් සිහි කිරීමේ' ජාත්‍යන්තර දිනයට සමගාමීව ශ්‍රී ලංකාවේ "මාර්ග ආරක්ෂණ ජනාධිපති සම්මාන උළෙල" යනුවෙන් අනතුරු වළක්වා ගැනීම දිරිගැන්වීමේ ව්‍යාපෘතියක් දියත් කර ඇත. මෙම වසරේ සිට එම සම්මාන ලබා දීම සඳහා ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන ඇමති බිමල් රත්නායක සහෝදරයා විසින් ඉදිරිපත් කර තිබූ ඇමති මණ්ඩල යෝජනාවට පසුගිය හත්වැනි දින අනුමැතිය ලබා දෙනු ලැබීය.

# කළු රාජ්‍යය මර්දනයට තවත් දැඩි ක්‍රියාමාර්ග

සංවිධානාත්මක අපරාධ කල්ලි මෙරට සීමාව ඉක්මවා ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වීම තවදුරටත් මර්දනය කිරීම සඳහා නව ක්‍රියාමාර්ග ගණනාවක් ඉදිරිපත් කරනු ලැබ තිබේ.

මේ සම්බන්ධයෙන් අධිකරණ, ජාතික ඒකාබද්ධ සහ මහජන ආරක්ෂක යන අමාත්‍යවරුන් ඒකාබද්ධව ඉදිරිපත් කර තිබූ යෝජනාවට පසුගිය හත්වැනි දින ඇමති මණ්ඩල අනුමැතිය හිමි විය. ඒ අනුව එක්සත් ජාතීන්ගේ සම්මුති බලාත්මක කිරීම, ජාතික සහ අන්තර් ජාතික සහයෝගීතාවය වඩාත් ඵලදායී ලෙස යොදා ගැනීම මගින් ජාත්‍යන්තර මට්ටමින් පැතිරී තිබෙන සංවිධානාත්මක අපරාධ කල්ලි මර්දනය කිරීමට අදාළ නීති කෙටුම්පත් කිරීමට සැලසුම් කර තිබේ.

# වැව් පද්ධතියේ හදවත් රැකීමට "ක්ලීන් ශ්‍රී ලංකා" සහය

මෙරට කෘෂිකාර්මික සහ පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා සුවිශේෂී මෙහෙවරක් ඉටුකරන ප්‍රධාන වැව් රැසක පෝෂක කලාප සංරක්ෂණය කිරීම සඳහා "ක්ලීන් ශ්‍රී ලංකා" ව්‍යාපෘතිය යොදා ගැනීමට සැලසුම් කරනු ලැබ තිබේ.

මෙහි පළමු අදියරේදී තෝරා ගත් ප්‍රධාන වැව් 21ක පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීමට නියමිතය. නුවර වැව, කන්තලේ වැව සහ තිස්ස වැව ඒ අතරින් ප්‍රධානය. වැවට අයත් පෝෂක ප්‍රදේශ මැනුම් කටයුතු සිදු කිරීම, මායිම් ගල් යෙදීම සහ රුක් රෝපණය මේ යටතේ සිදු කිරීමට සැලසුම් කර ඇති අතර කෘෂිකර්ම, පශු සම්පත් සහ ඉඩම් වාරිමාර්ග ඇමති කේ.ඩී. ලාල් කාන්ත සහෝදරයා විසින් මේ පිළිබඳව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල යෝජනාවට පසුගිය 14 දින අනුමැතිය ලැබිණි. මේ වෙනුවෙන් රුපියල් මිලියන 400ක වියදමක් දැරීමට සිදුවෙනු ඇතැයි ඇස්තමේන්තු කර තිබේ.

# මහජන සෞඛ්‍යයේ ගුණාත්මක නව පිම්මක්

ගුණාත්මක වශයෙන් උසස් සෞඛ්‍ය සේවාවක් ලබාදීම සඳහා විශේෂ ව්‍යාපෘති 39ක් ක්‍රියාත්මක කිරීමට රජය යෝජනා කර ඇති අතර, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය ඇමති වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා විසින් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල යෝජනාවට පසුගිය 14 වැනි දින අනුමැතිය ලබා දී තිබේ.

මෙම ව්‍යාපෘතිය එළඹෙන 2027 වසරේ සිට 2031 දක්වා කාල පරිච්ඡේදයට අදාළව ක්‍රියාත්මක කිරීමට නියමිතය. රජයේ රෝහල්වල මෙන්ම අනෙකුත් සෞඛ්‍ය සේවා ලබා දෙන රාජ්‍ය ආයතනවල යටිතල පහුසකම් සංවර්ධනය සහ නූතන සෞඛ්‍ය ප්‍රමිතීන්ට අදාළව ජන ජීවිතය උසස් කිරීම අරමුණු කර ගනිමින් මෙම ව්‍යාපෘතිය දියත් කෙරේ.

# අඩු ආදායම්ලාභී පවුල් සඳහා නව නිවාස ව්‍යාපෘතියක්

අඩු ආදායම්ලාභී පවුල් සඳහා සුරක්ෂිත ජීවිතයක් තහවුරු කිරීමට නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ කොළඹ 05, කාලිංග මාවතේ ඒකක 384කින් යුත් මහල් නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට පියවර ගෙන තිබේ.

නිවාස සංවර්ධන අධිකාරිය සහ කාන්තා කටයුතු හා ළමා කටයුතු අමාත්‍යාංශය මෙන්ම ඇග්‍රොමාට් පදනම ඒකාබද්ධව මේ සඳහා මුලපුරනු ලැබ ඇත. ඉදිරි වසර තුන තුළ ඉදිකිරීම් අවසන් කර, ජනතාවට පවරා දීමේ ඉලක්කය සහිතව කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය සරෝජා සාවිත්‍රි පෝල්රාජ් සහෝදරිය විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාවට පසුගිය 21 වැනි දින අනුමැතිය ලබාදී තිබේ.

# ක්‍රිකට් ක්‍රීඩාවට පණ දෙන අලුත් පනතක්

ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව ව්‍යුහාත්මකව ගොඩනැගීම අරමුණු කර ගනිමින් තරුණ කටයුතු සහ ක්‍රීඩා ඇමති සුනිල් කුමාර ගමගේ සහෝදරයා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාවකට පසුගිය 21 වැනි දින ඇමති මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී.

ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව නැවත ජයග්‍රාහී තලයකට ඔසවා තැබීම සඳහා යහපාලනය, සුපිළිපන්නභාවය, විනිවිදභාවය, වගකිවයුතුභාවය සහ සමාන අවස්ථා සැලසීම යන මූලධර්ම මත පදනම්ව ගුණාත්මකව ක්‍රීඩාව ඉහළ නැංවීම සඳහා නව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත. ක්‍රීඩකයන් ඇතුළු අදාළ සියලු පාර්ශ්වවල සුබසාධනය ආරක්ෂා කර ගනිමින් දූෂණයෙන් සහ අයුතු මැදිහත්වීම්වලින් තොර, ක්‍රිකට් ක්‍රීඩාවක් ස්ථාපිත කිරීම මෙම පනතේ මූලික අරමුණයි.

# සමාජ රැකවරණයට දස අවුරුදු සැලැස්මක්

ශ්‍රී ලාංකේය සමාජය අංශ ගණනාවකින් රැකවරණය සහ ගුණාත්මක වර්ධනයන් අත්පත් කර ගැනීම සඳහා ප්‍රධාන කුලුනු හතරක් මත ක්‍රියාත්මක වන දස අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය පසුගිය 28 වැනි දින ලබා දෙනු ලැබීය.

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් ඇමති උපාලි පන්නිල සහෝදරයා මෙම ඇමති මණ්ඩල යෝජනාව ඉදිරිපත් කර තිබුණි. සමාජ සාධාරණය, සමාජ රැකවරණය, සමාජ රක්ෂණය, ශ්‍රම වෙළඳපොළ සහ ඵලදායී අන්තර්ගතකරණය යන මූලික කුලුනු 04 මත 2035 වසර දක්වා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මකය.

නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# අපරාධකරුවන් වීරත්වයට නැංවීම

ලංකාව තුළ පසුගිය දශක 2ක පමණ කාලයක සිට ගොඩනඟා තිබූ අපරාධ රාජ්‍යය හා කළු ආර්ථිකය මාලිමාව බලයට පැමිණීමත් සමග බිඳ දැමීම ඇරඹුණි. එකී අපරාධ රාජ්‍යය ගොඩනැගූ, එයට දේශපාලන නායකත්වය දුන්, ඒ තුළ බියක් නැතිව මූල්‍ය හා විවිධ අපරාධ සිදු කළ පුද්ගලයන්ට එරෙහිව දැන් නීතිය ක්‍රියාත්මක වෙමින් තිබේ.

රටක් ආර්ථික වශයෙන් බංකොලොත් වී ජනතාව දුප්පත්කමේ පතුළට ඇද දැමීමට හේතු වූ මේ මහා පරිමාණ මූල්‍ය අපරාධකරුවන්ට හා තම බලය වෙනුවෙන් විරුද්ධවාදීන් දඩයම් කළ අපරාධකරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම පොදු ජනතාවගේ අපේක්ෂාව වේ. එසේම රටක යුක්ති ධර්මයට අනුවද එය එසේ විය යුතුය.

අපරාධවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමේදී ඊට අදාළ පුද්ගලයාගේ තරාතිරම, වත්පොහොසත්කම හෝ බලවත්කම අදාළ නොවිය යුතුය. මන්ද නීතිය සැමට එක සේ සාධාරණව ක්‍රියාත්මක කිරීම ශිෂ්ට සම්පන්න සමාජයක අත්‍යවශ්‍ය කරුණක් වන හෙයිනි.

එහෙත් ලංකාවේ මේ සාධාරණ, යුක්තිගරුක හා ස්වභාවික යුක්තියට අදාළ නෛතික ක්‍රියාවලට හා සමාජ මතයට අභියෝගයක් එල්ල වී තිබේ. ඒ සංවිධානාත්මකව හා රාජ්‍ය බලය, දේශපාලන බලය යොදා අපරාධ කළ වුන්ගේ කඳවුරෙනි. ඒ, අපරාධවලට, මූල්‍ය වංචාවලට සම්බන්ධ පුද්ගලයන්ට නීතිය ක්‍රියාත්මක වන විට ඊට එරෙහි වීම මගිනි; දේශපාලන පක්ෂපාතිත්වය මත අපරාධකරුවන් වීරයන් බවට පත් කිරීමට උත්සාහ කිරීම මගිනි.

අපරාධකරුවන් වීරයන් කිරීමේ වැරදි සම්ප්‍රදාය ආරම්භ කළේ 1977 ජේ.ආර්. ජයවර්ධන පාලන සමයේ සිටය. ඒ ස්ත්‍රී දූෂක අපරාධකරුවෙකු වූ සිර දඬුවම් විඳිමින් සිටි, ගෝනවල සුනිල්ට ජනාධිපති සමාවක් දී නිදහස් කර, පසුව සාමදාන විනිශ්චයකාර පදවියක්ද පිරිනැමීමෙනි. එම සමාජ විරෝධී, සදාචාර විරෝධී ක්‍රියාමාර්ග පසුව සම්ප්‍රදායක් බවට පත්කරනු ලබන්නේ රාජපක්ෂ පාලනය විසිනි. අදත් ඔවුන් පවත්වාගෙන යාමට උත්සාහ කරන්නේ එයයි.

අපරාධවලට චෝදනා ලැබ රක්ෂිත බන්ධනාගාර ගත කළ වුන්ට ඇප ලැබී එළියට එන විට, මල්මාලා දමා පිළිගැනීමට පාක්ෂිකයන් එක්කර ගැනීමේ සිට අපරාධකරුවන් වෙනුවෙන් බෝධි පූජා පැවැත්වීම, රැස්වීම් සංවිධානය කිරීම වැනි (අසාර්ථක) ක්‍රියා දක්වා මෙය පෙළගැසී තිබේ. මේ මොහොතේද බරපතළ අපරාධ කර ඇති දේශපාලුවන් වෙනුවෙන් මෙය ක්‍රියාවේ යෙදෙමින් තිබේ. එය ශිෂ්ට සම්පන්න සමාජයකට ඉතාම අහිතකරය.

සමාජයක චින්තනය සකස් විය යුත්තේ, සමාජයක ජනතාවගේ ප්‍රතිචාර තිබිය යුත්තේ වංචා, දූෂණ, අපරාධ ප්‍රතික්ෂේප කරන, ඒවා කළ වුන් කවුරුන් වුවත් හෙළා දකින, ඔවුන්ව අත්හරින, එවැන්නන් අධෛර්යමත් කරන පැත්තටය. එහෙත් දේශපාලන පක්ෂපාතිත්වය නිසා හෝ හිතවත්කම් නිසා අපරාධකරුවන් වීරත්වයට නංවන්නේ නම්, එවැනි සමාජයකට ඉදිරියට යාම දුෂ්කරය.

ලංකාවේ මෑතක් වන තුරුම පොදු ජන විඥානය සකස්ව තිබුණේ අපරාධ හා දූෂණවලට එරෙහිව ඒවා ප්‍රතික්ෂේප කරන පැත්තෙනි. සාමාන්‍යයෙන් ගමක යමෙක් කුඩා වරදකට පොලීසියට රැගෙන ගියත් ඉන්පසු ඔවුන් ගමට මුහුණ දීමට ලැජ්ජා සහගත විය. "අපේ පරම්පරාවේ කවුරුවත් පොලීසියක පස්පාගලාවත් නෑ." යනුවෙන් ජනයා ප්‍රකාශ කළේ මේ මනෝභාවය සහිතවය.

වරදක් නොකර කෙනෙකු සැකයකට ලක්වූ විටදී පවා ඔවුන් ලැජ්ජාවට පත් විය. ලැජ්ජාව හා අපරාධවලට ඇති බිය ජනයා තුළ තිබිණි. එය හොඳ දෙයකි. වරදට යමෙක් සිරගත වූ විට පවුලේ අනෙක් අයට ගමට මුහුණ දීමට නොහැකිව ගම අත්හැර ගිය අවස්ථාද තිබිණි. ජනයා අපරාධවලට, ඒවායේ චූදිතයන් වීමට එසේ බිය වූහ; ලැජ්ජා වූහ.

එහෙත් රාජපක්ෂවරු මේ මිනිස් මනෝභාවය වෙනස් කළහ. ඔවුන් කටයුතු කළේ අපරාධකරුවෙක් වුවත් "අපේ හොරා අපට හොඳා" ප්‍රතිපත්තිය තුළය. අපරාධකරුවන්ට එල්ල වන සමාජ විරෝධයෙන් මිදීමට සියලු අපරාධකරුවන් කැමතිය. එකෙකු හිරේ ගිය විට හිරේ යාමට නියමිත වූවන් හිරේ ගිය පුද්ගලයා වීරත්වයට නංවන්නේ තමන්ටද හිත හදා ගැනීමටය; නැති නම් නීතියෙන් ගැලවීමේ මගක් සෙවීමටය. හොරු, අපරාධකරුවන් එසේ හැසිරීම තර්කානුකූලය. එහෙත් පාක්ෂිකභාවය නිසා අන්ධ, යටත්වැසිභාවය නිසා ටික දෙනෙක් හෝ සාමාන්‍ය පුද්ගලයන් එසේ හැසිරෙන්නේ නම්, එය බරපතළය.

දැන් රටට අවශ්‍ය හොරකම, දූෂණය, වංචාව, අපරාධ, කවුරු කළත් එය පිළිකුල් කරන අපරාධ කිරීමට දේශපාලනඥයා හා බලවත් අය අධෛර්යයට පත් කරන ජනතා හැසිරීමකි. එසේ නැතිව අපරාධකරන වුන් වීරත්වයට නංවන හැසිරීමක් නොවේ.



පරිසර අමාත්‍ය
වෛද්‍ය ධම්මික පටබැඳි සහෝදරයා

# විසඳුම් වෙනුවෙන් එකට ගමන් කළ යුතුයි

***ආණ්ඩුවේ ගෙවුණු වසර දෙකට ආසන්න කාලය බලන විට පරිසර අමාත්‍යාංශය පැත්තෙන් පවතින අභියෝග කවරාකාරද?***

පරිසරය කියන්නේ සංවර්ධනයෙන් වෙන් කරලා කතා කරන්න පුළුවන් දෙයක් නොවෙයි. අපි මාර්ගයක් හදන විට, නිවාස ඉදිකරන විට, කර්මාන්තයක් ආරම්භ කරන විට, හෝටලයක් හදන විට ඒ හැම දෙයකටම පරිසරය සම්බන්ධ වෙනවා. ඒ නිසා පරිසර සංරක්ෂණය කියන්නේ වනාන්තරයක් හෝ සතෙක් ආරක්ෂා කිරීමෙන් පමණක් අවසන් වන කාර්යයක් නොවෙයි. අපේ ජලය, වාතය, පස, වෙරළ, තෙත්බිම්, ජෛව විවිධත්වය වගේම මිනිසාගේ ජීවිතයත් එහි කොටසක්.

අද පරිසර අමාත්‍යාංශය ඉදිරියේ තිබෙන විශාලම අභියෝගය තමයි සංවර්ධනය සහ පරිසර සංරක්ෂණය අතර නිවැරදි සමබරතාව සොයා ගැනීම. රටකට සංවර්ධනය අවශ්‍යයි. ජනතාවට මාර්ග අවශ්‍යයි, නිවාස අවශ්‍යයි, රැකියා අවශ්‍යයි, කර්මාන්ත අවශ්‍යයි. සංචාරක ව්‍යාපාරයත් දියුණු කළ යුතුයි. නමුත් ඒ සියල්ල පරිසරය විනාශ කරමින් කළොත්, අද අපි ලබාගන්නා සංවර්ධනයේ මිල ගෙවන්න වෙන්නේ අනාගත පරපුරටයි. අද අප මුහුණ දෙන දේශගුණික විපර්යාස, වනාන්තර විනාශය, ජෛව විවිධත්වය අහිමි වීම, ජල දූෂණය, අපද්‍රව්‍ය ගැටලුව, වෙරළ ඛාදනය සහ අලි-මිනිස් ගැටුම වෙන් වෙන් වූ ප්‍රශ්න ලෙස දැකිය නොහැකියි. ඒවා එකිනෙකට සම්බන්ධයි. ඒ නිසා විසඳුමක් සොයන විටත් එක් ආයතනයක් පමණක් නොව, සියලු අදාළ ආයතන සහ ජනතාව එකට ගමන් කළ යුතුයි.

අපි තවත් දෙයක් තේරුම් ගත යුතුයි. නීතියක් තිබීම පමණක් ප්‍රමාණවත් නැහැ. නීතිය ක්‍රියාත්මක විය යුතුයි. ක්ෂේත්‍රයේ සිටින නිලධාරියාට අවශ්‍ය පහසුකම් තිබිය යුතුයි. ජනතාවට පරිසර ප්‍රතිපත්ති පිළිබඳ අවබෝධයක් තිබිය යුතුයි. එම නිසා පරිසරය පිළිබඳ නිවැරදි දැක්මක් රජය තුළත්, ජනතාව තුළත් ඇති කිරීම අප ඉදිරියේ තිබෙන ප්‍රධාන අභියෝග යක් ලෙස මම දකිනවා.

***ගෙවුණු වසර දෙකේ පරිසර ක්ෂේත්‍රය වෙනුවෙන් ගත් වැදගත් පියවරයන් කෙටියෙන් සඳහන් කරන්න පුළුවන්ද?***

පරිසරය කියන්නේ එක් ව්‍යාපෘතියකට සීමා වූ විෂයක් නොවන බව පැහැදිලියි. දේශගුණික විපර්යාසවල සිට වනාන්තර, ජලය, තෙත්බිම්, වෙරළ, අපද්‍රව්‍ය, වායු තත්වය සහ වනජීවී සංරක්ෂණය දක්වා විවිධ ක්ෂේත්‍ර ගණනාවක වැඩසටහන් අප ක්‍රියාත්මක කර තිබෙනවා.

දේශගුණික විපර්යාස සම්බන්ධයෙන් ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන් වන NDC 3.0 සකස් කර පැරිස් ගිවිසුමට ඉදිරිපත් කර තිබෙනවා. ඒ වගේම 2026-2035 ජාතික අනුවර්තන සැලැස්ම සකස් කර තිබෙනවා. දේශගුණික අවදානම්වලට මුහුණ දීම, ජල සම්පත් ආරක්ෂා කිරීම, කෘෂිකර්මාන්තය සහ ජනාවාස ආරක්ෂා කිරීම වැනි කරුණු මෙහිදී වැදගත්.

වනාන්තර සම්බන්ධයෙන් "වනස්පති" වැඩසටහන යටතේ නීතිමය ආරක්ෂාව ලබාදීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. මේ වසර දෙකකට ආසන්න කාලය තුළදී අප රක්ෂිත 113ක් ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ තුළ හෙක්ටයාර 71,990කට (අක්කර 179,975) අදාළ කැලෑ අඩංගු වෙනවා. ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම, ජල පෝෂක ප්‍රදේශ සංවර්ධනය, ගෝනමේරියාව තෙත්බිම් පද්ධතිය ආරක්ෂා කිරීම සහ "පරිසර දියවර" වැනි වැඩසටහන්ද මේ කාලය තුළ ක්‍රියාත්මක කර තිබෙනවා.

ඒ වගේම අපට පුළුවන් වුණා වසර 26 ක් පුරා සංශෝධනයට ලක් නොවී තිබුණු ජාතික පාරිසරික පනත සංශෝධනය කර අදට ගැලපෙන ලෙස සංශෝධනය කරන්න. පසුගිය සමයේ පරිසර අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල විශාල පුරප්පාඩු ප්‍රමාණයක් ඇති වී තිබුණා. මානව සම්පත් හිඟයක් වර්ධනය වී තිබුණා. මෙම අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීම සඳහා වන ජීවී නිලධාරීන්, පරිසර නිලධාරීන් ඇතුළු විවිධ තනතුරු සඳහා 1600කට වැඩි ප්‍රමාණයක් බඳවා ගැනීමට අවසර ලබා ගත්තා. අලි වැට සහායකයින් 3500ක් පමණ බඳවා ගෙන අවසන්.

ඒ වගේම අපද්‍රව්‍ය සහ ප්ලාස්ටික් කළමනාකරණය, වායු තත්ව නිරීක්ෂණය, වෙරළ සංරක්ෂණය සහ පාරිසරික කටයුතු ඩිජිටල්කරණය වැනි ක්ෂේත්‍රවලත් විශාල වැඩ කොටසක් සිදු වෙමින් තිබෙනවා. වැදගත්ම දෙය වන්නේ මේ වැඩසටහන් එකිනෙකින් වෙන් කර නොගෙන, පරිසරය පිළිබඳ සමස්ත දැක්මක් තුළ ක්‍රියාත්මක වීමයි.

***අලි-මිනිස් ගැටුම දීර්ඝ කලක් තිස්සේ පවතින සංවේදී ප්‍රශ්නයක්. මේ වෙනුවෙන් මොන වගේ ප්‍රවේශයක්ද තියෙන්නේ?***

අලි-මිනිස් ගැටුම කියන්නේ අද ඊයේ ඇති වූ ප්‍රශ්නයක් නොවෙයි. දීර්ඝ කාලයක් තිස්සේ අපි මේ ප්‍රශ්නය සමඟ ජීවත් වෙනවා. එහිදී අපට අමතක කළ නොහැකි කරුණක් තිබෙනවා. අලියා ආරක්ෂා කළ යුතුයි. ඒ වගේම අලියා සමඟ එකම භූමිය බෙදාගෙන ජීවත් වන මිනිසාත් ආරක්ෂා කළ යුතුයි.

ඒ නිසා ගැටුමක් ඇති වූ පසු අලියා පලවා හැරීම හෝ මිනිසාට වන්දි ලබාදීම පමණක් විසඳුමක් ලෙස දැකීම ප්‍රමාණවත් නැහැ. ගැටුම ඇති වීමට හේතුව කුමක්ද කියලා බලන්න ඕනෑ. අලි වාසස්ථාන ආරක්ෂා කිරීම, අලි මංකඩ රැකගැනීම, වනාන්තර ප්‍රතිසංස්කරණය කිරීම, අලින්ට අවශ්‍ය ආහාර හා ජලය වනාන්තර තුළම පවත්වා ගැනීම වැනි දේවල් ඒ නිසා වැදගත්.

2025 වසරේදී ගැටුම උග්‍ර ප්‍රදේශවල කිලෝමීටර් 167කට වැඩි විදුලි වැට ඉදිකර තිබෙනවා. 2026 වසරේදී තවත් කිලෝමීටර් 59කට වැඩි විදුලි වැට ඉදිකර තිබෙනවා. හඳපානාගල-දෙමෝදර, කෝලංගල සහ වැටහිරකන්ද යන අලිමංකඩ ගැසට් කිරීම සඳහාත් කටයුතු කර තිබෙනවා. ක්ෂේත්‍රයේ සිටින වනජීවී නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් ලබාදීමත් මෙහිදී වැදගත්. ඩබල් කැබ් රථ, යතුරුපැදි සහ ට්‍රැක්ටර් ලබාදී තිබෙනවා. ඉදිරියේදී තවත් වාහන ලබාදීමට සැලසුම් කර තිබෙනවා. තාක්ෂණයත් මේ සඳහා යොදාගන්නවා. දුම්රිය මාර්ගයට ආසන්නව සිටින අලින් හඳුනාගෙන දුම්රිය රියදුරන්ට පූර්ව දැනුම්දීම සඳහා කෘත්‍රිම බුද්ධිය භාවිත කරන ව්‍යාපෘතියක් හඳුන්වා දී තිබෙනවා.

අලි-මිනිස් ගැටුමට එක දවසකින් විසඳුමක් හොයන්න බැහැ. ඒක දිගුකාලීනව, විද්‍යාත්මකව සහ ජනතාවගේ සහභාගිත්වයෙන් කළ යුතු වැඩක්. අවසාන අරමුණ අලියාත්, මිනිසාත් දෙපාර්ශ්වයම ආරක්ෂා කිරීමයි.

***මධ්‍ය කඳුකරය සංරක්ෂණය වෙනුවෙන් කැබිනට් මණ්ඩලය විශේෂ ආයතනයක් පිහිටුවන බව ප්‍රකාශ වුණා. මෙහි අරමුණ පැහැදිලි කරනවද?***

මධ්‍ය කඳුකරය කියන්නේ ශ්‍රී ලංකාවේ පරිසර පද්ධතියේ හදවත වගේ. අපේ ප්‍රධාන ගංගා රැසක ආරම්භය තිබෙන්නේ මේ ප්‍රදේශයේ. ඒ නිසා මධ්‍ය කඳුකරය

11 වැනි පිටුවට

> සියල්ල පරිසරය විනාශ කරමින් කළොත්, අද අපි ලබාගන්නා සංවර්ධනයේ මිල ගෙවන්න වෙන්නේ අනාගත පරපුරටයි. අද අප මුහුණ දෙන දේශගුණික විපර්යාස, වනාන්තර විනාශය, ජෛව විවිධත්වය අහිමි වීම, ජල දූෂණය, අපද්‍රව්‍ය ගැටලුව, වෙරළ ඛාදනය සහ අලි-මිනිස් ගැටුම වෙන් වෙන් වූ ප්‍රශ්න ලෙස දැකිය නොහැකියි. ඒවා එකිනෙකට සම්බන්ධයි. ඒ නිසා විසඳුමක් සොයන විටත් එක් ආයතනයක් පමණක් නොව, සියලු අදාළ ආයතන සහ ජනතාව එකට ගමන් කළ යුතුයි.






# Yes We Can

## සිහින දකින දූෂිතයින් හෙළිදරව් කළ යුතුය...

2029 ජනාධිපතිවරණයට දැන් සිටම සූදානම් වන සිහින ජනාධිපතිවරු ගණනාවක් විවිධ ක්‍රියාමාර්ගවල නිරතවෙමින් සිටිති. නාමල් රාජපක්ෂද තම සිහිනය වෙනුවෙන් විවිධ ක්‍රියාකාරකම්වල නිරත වන්නේ සිහිනය හැබෑ නොවන බව ඉඳුරාම තහවුරු කරගෙනය. නමුත් මෙම ක්‍රියාකාරකම්වල ප්‍රධාන අරමුණ වනුයේ තමාට එල්ල වී ඇති බොහෝ චෝදනා හා නෛතික ක්‍රියාමාර්ග පිළිබඳ සමාජ අවධානය වෙනතකට යොමු කිරීමය. මෙසේ කල් තබාම ජනාධිපතිවරණයට සූදානම් වන දූෂිත රාජපක්ෂ කවුද යන්න සමාජය හමුවේ නිරාවරණය කළ යුතුය.

එයාර්බස් ගනුදෙනුව, නැතිනම් එයාර්බස් වංචාව අපේ රටට සිදුකර ඇති පාඩුව ගණනය කළ නොහැකි තරම්ය. දැනට ආසන්න වශයෙන් ඩොලර් මිලියන 200 ඉක්මවූ පාඩුවක් මෙමගින් සිදු වී ඇති බව පුරෝකථනය කෙරේ. මෙම ගනුදෙනුවට අදාළව ඩොලර් මිලියන 16ක අල්ලසක් ඉල්ලා ඇති බව පරීක්ෂණවලින් තහවුරු වී ඇති අතර එම අල්ලස් මුදලින් රු.මි. 100ක් නාමල් රාජපක්ෂ වෙත ලබාදුන් බවට නිමල් පෙරේරා දිවුරුම් ප්‍රකාශයක් ලබාදී ඇත. එමෙන්ම මෙම ප්‍රශ්නගත එයාර්බස් සමාගම සමග එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂගේ පුත් මගින් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා මැදිහත්වීමක් හා බලපෑමක් වී ඇති බව සඳහන් ඊමේල් පණිවිඩ හුවමාරු වී ඇති බවද අධිකරණයට අල්ලස් කොමිසම මගින් වාර්තා කර ඇත. මෙලෙස සිදු වී ඇති මෙම කූඨ එයාර්බස් අල්ලස් සිදුවීමට අදාළව මේ වන විට නාමල් රාජපක්ෂ රක්ෂිත බන්ධනාගාර ගතව සිටියි.

එමෙන්ම කුප්‍රකට ක්‍රිෂ් ගනුදෙනුවේදීද අල්ලස් මුදල් හුවමාරු වී ඇති බවට අල්ලස් කොමිසම විසින් අධිකරණයට වාර්තා කර ඇත. එසේම මෙම ඉන්දියානු ක්‍රිෂ් සමාගම නීති විරෝධී මුදල් භාවිත කරමින් මෙරට තුළ ක්‍රියාත්මක වී ඇති බව ඉන්දියානු රජය විසින්ද තහවුරු කරනු ලැබ ඇති අතර ඒ බව අධිකරණයටද වාර්තා කර ඇත. ක්‍රිෂ් සමාගමට පැවරූ මෙම ඉඩම, ක්‍රිෂ් සමාගමට පැවරීමට පෙර මහජන බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව හා විදුලිබල මණ්ඩලය යන ආයතන විසින් භාවිතා කර, එම ඉඩම සඳහා විශාල මුදල් ආයෝජනය කර සංවර්ධනය කර තිබුණද ඒ කිසිවක් නොසලකා, එම ආයතනවලට සිදුවූ පාඩුව ගණනය කර වන්දි ලබාදීමේ ක්‍රියාවලියක්වත් සිදු නොකර, ඉතා කඩිනමින් නාගරික සංවර්ධන අධිකාරිය මගින් මෙම ඉඩම මෙම ප්‍රශ්නගත සමාගමට පවරා තිබේ.

මෙලෙස ලහි ලහියේ මෙම ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය මගින් පැවරීමට කටයුතු සලසාදීම වෙනුවෙන් රුපියල් මිලියන 70ක මුදලක් එවකට නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය සභාපතිවරයා ලෙස කටයුතු කළ නිමල් පෙරේරාගේ ගිණුමකට බැර කරනු ලැබ ඇත. එම රුපියල් මිලියන 70ක මුදල නාමල් රාජපක්ෂ සභාපතිත්වය දැරූ ක්‍රීඩා සමාජයක් වෙත ලබා දුන් බවට නිමල් පෙරේරා විසින් සාක්ෂි ලබා දී ඇත. එනිසා මිලියන 70ක මුදලක් අල්ලසක් ලෙස ලබාගැනීමට අදාළව අල්ලස් කොමිසම මගින් අධි චෝදනා ගොනුකර නාමල් රාජපක්ෂට එරෙහිව තවත් නඩුවක් විභාග වෙමින් පවතී.

එසේම ගවර්ස් කෝපරේට් සර්විස් (Gowers Corporate Services) යන සමාගම මගින් එන්.ආර්. කන්සල්ටන්සි (NR Consultancy) සමාගමේ කොටස් මිලදී ගැනීමට රුපියල් මිලියන 45ක මුදල් යොදවා ඇත. මෙම රුපියල් මිලියන 45ක මුදල මුදල් විශුද්ධිකරණය මගින් උපයාගෙන ඇති බවට අනාවරණය විය. පරීක්ෂණවලදී අනාවරණය වූයේ මෙම සමාගම් දෙකෙහිම හිමිකරු නාමල් රාජපක්ෂ බවයි. මේ නිසා මෙම මුදල් විශුද්ධිකරණ චෝදනාවේ ප්‍රධාන විත්තිකරු ලෙස නම් කරනු ලැබ ඇත්තේ නාමල් රාජපක්ෂය. ඊට අදාළ නඩුවක්ද විභාග වෙමින් ඇත.

එසේම සීඑස්එන් නාලිකාවේ නඩු විභාගයට, ගුවන් සේවිකාවක් වන අසංගි නවරත්න යන සේවිකාව දේශපාලන වැඩවලට යොදවාගෙන ශ්‍රී ලංකන් ගුවන් සේවය මගින් එම කාලසීමාවට අදාලව ලක්ෂ 46ක් වැටුප් ගෙවීම මගින් රජයට පාඩුවක් සිදුකිරීමට එරෙහි නඩුවලට මෙන්ම, නීතිඥවරයෙකු ලෙස පත්වීම පිළිබඳව ජනාධිපති කොමිසමේ වාර්තා හා චෝදනාද මෙම 'සිහින ජනාධිපතිවරයා' විසින් සිදුකර ඇති හෝ සම්බන්ධ වී ඇති දූෂණ අක්‍රමිකතාවන් අතරට ඇතුළත් වේ.

මෙලෙස අල්ලස් චෝදනා, දූෂණ චෝදනා, අක්‍රමිකතාවන් හා මුදල් විශුද්ධිකරණ චෝදනා ලැබූවෙකු 2029 ජනාධිපතිවරණයට සූදානම් වීම ඊනියා නාටකයක් බව සමාජය හමුවේ හෙළිදරව් කළ යුතුය. මෙවැනි දූෂිතයින් නව දේශපාලන සංස්කෘතියක් අපේක්ෂා කරන වත්මන් ජනවරමේ ශක්තියෙන් මුළුමනින්ම පරාජයටද පත්කළ යුතුය.

## තාරුණ්‍යයේ මාලිමාව "චේ"...

ලෝක සිතියමේ
තිත් අතර
ආජන්ටිනාව
කියුබාව
බොලිවියාව
හා
විමුක්තිය..!
ලොවම එක මව්බිමක්...
අරගලයේ ධෛර්ය
විවර කළ...

හැම දුගී පැලකම
කොඳුරනා සුසුමට,
නොනිමි කම්පනය
අසීමිත ආදරය...
ලොවටම...

දෑත රැඳි ගිනිඅවිය
හෙට පිණිස,
හිස පැළඳි රතු තරුව
චේ..
"අරගලයේ සංකේතය..!"

උණ්ඩයක් පසරු කළ'මුත්
'ආදරය' පිරි හදවත
විවරව තවමත්
නොමියැදී ලොවැසි
පපු ගැබ...

විමුක්තිය, සාමය
උදාවන දිනයක ලොව
ලියැවෙයි වෙව්ලන දෑතින්
"සදාකාලික ලොබැඳි හදවත"
'චේ..'

# චේ

## බලය වෙනුවෙන් නොව, වෙනස වෙනුවෙන් සටන් කළ තරුණයා

*(ඔක්තෝබර් 08 චේ දිනය වෙනුවෙනි)*



ලෝකයේ දේශපාලන ඉතිහාසය තුළ ඇතැම් චරිත පිළිබඳ කතාබහ ඔවුන් මියගිය පසුවද අවසන් නොවේ. ඔවුන්ගේ අදහස්, අරගල සහ සමාජය පිළිබඳ ඔවුන් නැඟූ හඬ පරම්පරාවෙන් පරම්පරාවට ගමන් කරයි. අර්නෙස්ටෝ 'චේ ගුවේරා' එවැනි චරිතයකි.

1928 ජුනි 14 වැනිදා ආර්ජන්ටිනාවේ උපත ලැබූ චේ වෛද්‍යවරයෙකු විය. එහෙත් ලතින් ඇමරිකාව පුරා කළ සංචාරවලදී දුටු දරිද්‍රතාව, සමාජ අසමානතාව සහ ජනතාව පෙළූ අසාධාරණත්වය ඔහුගේ ජීවිතයේ ගමන් මඟ වෙනස් කළේය. වෛද්‍යවරයෙකු ලෙස එක් පුද්ගලයෙකු සුවපත් කිරීමෙන් ඔබ්බට ගොස්, මිනිසුන්ගේ ජීවිත පීඩාවට පත්කරන සමාජ ක්‍රමය පිළිබඳ ප්‍රශ්න කිරීමට ඔහු යොමු විය.

කියුබානු විප්ලවය සමඟ ඔහුගේ දේශපාලන භූමිකාව වඩාත් ප්‍රබල විය. සමාජ සාධාරණත්වය, සමානාත්මතාව සහ අධිරාජ්‍යවාදයට එරෙහි අරගලය ඔහුගේ දේශපාලන චින්තනයේ වැදගත් ස්ථානයක් ගත්තේය.

අද ශ්‍රී ලංකාව නව දේශපාලන පරිච්ඡේදයකට පිවිස ඇති අවස්ථාවක චේ පිළිබඳව නැවත කියවීම වැදගත් වන්නේ එබැවිනි. වර්තමාන ජාතික ජන බලවේගයේ පාලනය තුළ ජන සහභාගිත්වය, සමාජ සාධාරණත්වය සහ පද්ධතිමය වෙනස්කම් පිළිබඳ අදහස් අවධාරණය කර ඇත.

එවැනි පසුබිමක වාමාංශික තරුණ ව්‍යාපාරයකට චේ දිනය යනු හුදු සැමරුමකට පමණක් සීමා කළ හැකි දිනයක් නොවේ. එය අප සමාජය කොතැනද? අප යා යුත්තේ කොතැනටද? වෙනසක් ඇති කිරීමේදී තරුණයාගේ වගකීම කුමක්ද? යන ප්‍රශ්න නැවත මතු කරන අවස්ථාවකි.

චේගේ ජීවිතය අපට පෙන්වා දෙන්නේ දේශපාලනය යනු බලය ලබාගැනීම පමණක් නොවන බවයි. එය ජනතාවගේ ජීවිතය, සමාජයේ අසමානතා සහ අනාගත පරපුර පිළිබඳ වගකීමක්ද වේ. අද තරුණයාගේ අරගලයද එම අර්ථයෙන් නව ස්වරූපයක් ගත යුතුය.

අද තරුණ පරපුරට මුහුණදීමට සිදුව ඇති රැකියා අර්බුද, අධ්‍යාපන අවස්ථාවන්හි අසමානතා, ආර්ථික පීඩනය, තාක්ෂණික වෙනස්කම් සහ පරිසර අර්බුදවලට විසඳුම් සෙවීමේදී තරුණයා හුදෙක් ප්‍රේක්ෂකයෙකු නොවිය යුතුය. දැනුමෙන්, සංවිධානයෙන් සහ නිර්මාණශීලීත්වයෙන් සමාජය වෙනස් කිරීමේ ක්‍රියාවලියේ සක්‍රීය කොටස්කරුවෙකු විය යුතුය.

1967 ඔක්තෝබර් 09 වැනිදා චේ මිය ගියද, ඔහු නියෝජනය කළ ප්‍රශ්න තවමත් ජීවමානය. මිනිසා වෙනුවෙන් දේශපාලනයක් කෙසේ ගොඩනගන්නේද? සමාජ සාධාරණත්වය යථාර්ථයක් කරන්නේ කෙසේද? තරුණ පරපුර වෙනසෙහි බලවේගයක් කරන්නේ කෙසේද?

චේ දිනයේ සැබෑ අරුත වන්නේ ඔහුගේ රුව සිහිපත් කිරීම පමණක් නොව, ඔහුගේ කාලයේ ඔහු මතු කළ සමාජ ප්‍රශ්න අපේ කාලයේදී නැවත කියවීමයි.

චේ ජීවමාන වන්නේ රුවක නොව, අසාධාරණය ප්‍රශ්න කරන තරුණ සිතකය.

චේ ජීවමාන වන්නේ වෙනසක් ගැන සිතන පරපුරකය.




### කරාබුවක සැඟවුණු අරක්ෂිත කැමරාව...



අප දිනපතා පළඳින කණේ කරාබුවක කැමරාවක් සවි කරන ලද සරල උපාංගයක් නිපදවීමට දකුණු අප්‍රිකානු සිසුවියක වන 16 හැවිරිදි Bohlale Mphahlele සමත් වී තිබේ. ඇයට මෙම අදහස පහළ වී ඇත්තේ පාසල් යන අතරතුරදීය. යම්කිසි අනතුරුදායක තත්වයකදී හෝ හදිසි අවස්ථාවකදී කිසිවෙකුටත් නොපෙනෙන කැමරාවක් සඟවා ඇති ස්මාර්ට් කරාබුව "Alerting Earpiece" (අනතුරු ඇඟවීමේ කන්-උපාංගය) පුද්ගලික ආරක්ෂාව සඳහා භාවිතා කිරීමට හැකියාව ඇත. මෙම රහසිගත උපාංගය ලිංගිකත්වය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීමට උපකාරී වන අතර මෙය, රූප ලබා ගැනීම, සජීවී GPS ස්ථාන තොරතුරු බෙදා ගැනීම සහ හදිසි අනතුරු ඇඟවීම් යැවීම වැනි කාර්යයන් ඉටු කරයි. ඇයගේ මෙම ව්‍යාපෘතිය දැනටමත් 'Eskom Expo for Young Scientists. (තරුණ විද්‍යාඥයින් සඳහා වන Eskom ප්‍රදර්ශනය) හි අවධානයට සහ ඇගයීමට ලක්ව තිබේ.

### චීනය බතලවලින් හදන "හොෂි ඉමෝ"



අපි තවමත් බතල තම්බා කෑමට ගනිද්දී චීනය බතලවලින් ඩොලර් මිලියන ගණන් උපයන බව ඔබ දන්නවද ...? වියළන ලද සහ බේක් කරන ලද මෘදු බතල චීනය විසින් හඳුන්වනු ලබන්නේ "හොෂි ඉමෝ" ලෙසයි. අස්වැන්න නෙළා ගත් පසු බතල සෝදා පිරිසිදු කර තුන් වරක් පදම් කරමින් 140$^{0}$C හුමාලයෙන් තම්බා ගනිමින් තෙතමනය ඉවත් කිරීම සිදුකරයි. එය පසුව මෘදු සහ chew ආකාරයට පදම් වේ. ස්වයං රැකියා නවෝත්පාදකයින් සඳහා මෙම නිෂ්පාදන සැකසීමේ සංකල්පය ආර්ථික වශයෙන් බෙහෙවින් ඉවහල් වී ඇත.

### වවුලන් ඇති කර ලක්ෂ ගණන් සොයන වියට්නාමය



අපට කරදරයක් විදිහට පෙනෙන සමහර දේවල් වෙනස් විදියට සිතා ලක්ෂ ගණන් මුදල් ඉපයීමට වියට්නාමයේ ගොවිපළවල් සමත් වී තිබේ. ඒ අනුව වියට්නාමයේ ගොවීන් විසින් ඔවුන්ගේ කුඹුරු මැද උසට මඩු සකසා එම වහලවල්වල වියළි තල් කොළ එල්ලනු ලබයි. දහවල් කාලයේදී වවුලන් දහස් ගණනක් පැමිණ මේ තල් කොළ අස්සෙ හැංගි සිටින අතර රාත්‍රී කාලයේදී මෙම වවුලෝ වගාවන්හි පියාසර කරමින් වගාවට හානි කරනු ලබන කෘමීන් දහස් ගණන් එක රැයක් තුළ කා දමති. එපමණක් නොව වහලයට අතුරා තිබෙන දැල්වලින් එකතු කරගන්නා Guano නම් වවුල් බෙට් ඉතාම ඉහළ මිලකට කාබනික පොහොර ලෙස අලෙවි කරනු ලබයි. මෙම කාබනික පොහොරවල නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම් වැනි ඉහළ ගුණයකින් යුතු පෝෂක ද්‍රව්‍ය අඩංගු වේ. මෙවැනි පරිසර හිතකාමී සරල සංකල්ප හා උපක්‍රම භාවිතා කරමින් තිරසාර සංවර්ධනය උදෙසා ස්වාභාවික සම්පත් කළමනාකරණය කර ගත හැකිය.

# ආණ්ඩුවට වසර 2යි!
# මෙතනින් එහාට?



"දයලෙක්තික දර්ශනයට කිසිවක් නිත්‍ය, සර්ව සම්පූර්ණ හෝ ශුද්ධ හෝ නොවේ. එය සෑම දෙයක්ම හා සෑම දෙයකම තාවකාලික බව අනාවරණය කරයි. ඇති වීමේ හා නැති වීමේ, පහළ සිට ඉහළට වන අනන්ත උද්ගමනයේ ක්‍රියාදාමය හැර වෙනත් කිසිවක් එය හමුවේ ඔරොත්තු දීමට අසමත්ය."

**ලෙනින්**
**තෝ. කෘති, 01 වෙළුම, 18-19 පිටු**

ජාතික ජන බලවේගයේ ජනාධිපති අපේක්ෂක අනුර කුමාර දිසානායක සහෝදරයා 2024 ජනාධිපතිවරණය ජයග්‍රහණය කොට ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දුන්නේ සැප්තැම්බර් 23 දිනය. ඒ අනුව මාලිමා ආණ්ඩුවට වසර 02ක් පිරී තිබේ. වෙන කිසිවක් නැතත් විපක්ෂයේ විවිධ අනාවැකි බොරු කරමින් ආණ්ඩුව දෙවසරක් සම්පූර්ණ කිරීමම ජයග්‍රහණයක් වේ.

ගෙවුණු වසර 02ක තුළ ජනතාව වෙනුවෙන් හා තම ආණ්ඩුවේ අරමුණු වෙනුවෙන් ආණ්ඩුව ගත් ක්‍රියාමාර්ග හා කළ කී දේ පිළිබඳ පසුගිය දිනවල විශාල වශයෙන් සාකච්ඡා විය. එබැවින් එම කරුණු නැවත නැවතත් කථාකිරීම අවශ්‍ය නැත. මේ ලිපියේ අරමුණ වන්නේ වසර දෙක නිමා කළ ආණ්ඩුවට මෙතැනින් ඔබ්බට තිබෙන කාර්යභාරය හා අභියෝග පිළිබඳ විමසා බැලීමය.

2024 ජනාධිපතිවරණයේදී තමන් වෙත බලය ඉල්ලා ජාතික ජන බලවේගය විසින් ජනතාවට ඉදිරිපත් කළ 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' ලෙස නම් කළ ප්‍රතිපත්ති ප්‍රකාශය, මැතිවරණ ජයග්‍රහණයෙන් පසු ආණ්ඩුවේ ප්‍රතිපත්ති මාලාව ලෙස ආණ්ඩුව විසින්ම නිල වශයෙන් පිළිගනු ලැබීය. ලංකාවේ එවැන්නක් සිදු වූ පළමු අවස්ථාව එය විය. දැන් ආණ්ඩුව කටයුතු කරන්නේ එම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ඉදිරිපත් කළ ප්‍රතිපත්තිවලට අනුව රට ගොඩනැගීමටය.

පසුගිය වසර දෙක තුළ ආණ්ඩුවේ ක්‍රියාමාර්ග දෙස බලන විට පෙනී යන ප්‍රධාන කරුණ වනුයේ එය එකිනෙකට අන්තර් සම්බන්ධයක් නැති හුදකලා ක්‍රියාමාර්ග තැනින් තැනට ගන්නවා වෙනුවට එක් සැලැස්මක කොටස් ලෙස විවිධ ක්‍රියාමාර්ග ගන්නා බවය. මෙය මීට පෙර ආණ්ඩුවල නොතිබූ ලක්ෂණයකි. ආණ්ඩුව සැලැස්මක් අනුව සෙමින් වුවත් ස්ථිරව අරමුණකට කටයුතු කරන බව මූල්‍ය ක්ෂේත්‍රය, ප්‍රවාහනය, ගමනාගමනය, සෞඛ්‍යය, අධ්‍යාපනය, කෘෂිකර්මාන්තය, කර්මාන්ත, තාක්ෂණය, සංස්කෘතික ක්ෂේත්‍රය, නීතිය ආදී සෑම ක්ෂේත්‍රයකම සිදුකරන වෙනස්කම් දෙස බලන විට පෙනේ.



මාලිමා ආණ්ඩුව ඉදිරියේ ඇත්තේ ආර්ථිකය ස්ථාවර කරගෙන රට පවත්වාගෙන යාම වැනි සරල කාර්යයක් නොවේ. එය බිඳ වැටුණ ආර්ථිකය ස්ථාවර කර ශක්තිමත්ව ගොඩනැගිය යුතුය. ඒ තුළ ක්‍රමානුකූලව ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය (හැම දෙනාටම ආර්ථිකයට සම්බන්ධ වීමට අවස්ථාව සැලසීම) හා ආර්ථික සාධාරණත්වය (ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ ජනතාවට සාධාරණව ගලා යාම) ඇති කළ යුතුය. වෙනස වන්නේ එයයි. එසේම සියලු මහජන සේවාවල ප්‍රමාණාත්මක පමණක් නොව ගුණාත්මක පරිවර්තනයක් කළ යුතුය. උදාහරණයක් ලෙස ප්‍රවාහනය හා ගමනාගමනය දියුණු කිරීමට අලුත් බස් රථ ප්‍රමාණයක් ගෙනඒම පමණක් ආණ්ඩුවේ අරමුණ වන්නේ නැත. ජනතාවට පහසු හා විනයගරුක ප්‍රවාහනයක් සඳහා පහසුකම් සහිත බස් රථ මෙන්ම ඒ තුළ විනය, සදාචාරය නිර්මාණය කරමින් ප්‍රවාහනයේ නව විප්ලවයක් ඇති කිරීම ආණ්ඩුවේ අරමුණ බව පෙනේ.

අධ්‍යාපනයේ හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේද මෙය මෙසේමය. අධ්‍යාපනය තුළ පාසල් ඉදිකිරීම, උපකරණ දීම වැනි සරල සීමාවෙන් එහා ගොස් දරුවන්ට හා දෙමව්පියන්ට බරක් නැති විභාග වෙනුවෙන් කටපාඩම් කරන දරු පරපුරක් වෙනුවට නිර්මාණශීලීත්වයට ප්‍රමුඛතාවය දෙන දරුවන් ගොඩනගමින්, සැහැල්ලුවෙන් කරනු ලබන ඉගෙනීමක් බවට අධ්‍යාපනය පරිවර්තනය කළ යුතුය.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේද අරමුණ ලෙඩුන්ට බෙහෙත් කිරීම වෙනුවට නිරෝගී පරපුරක් ගොඩනැගීමත්, සෞඛ්‍ය පහසුකම් හොඳින් ලබාදීම සහ රෝග ප්‍රතිකාර සඳහා ජනතාව අනවශ්‍ය ලෙස වියදම් කිරීම අඩුකිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති ක්‍රියාවට නැගීමත්ය. මෙය හැම ක්ෂේත්‍රයකටම අදාළය.

වර්තමාන ආණ්ඩුව ඉදිරියේ ඇති අභියෝගය වන්නේ රටේ භෞතික සම්පත් වැඩිකිරීම මගින් කරන භෞතික සංවර්ධනය පමණක් නොවේ. ඒ සමගම ජනතාවගේ අධ්‍යාත්මික සංවර්ධනයද සිදු කළ යුතුය. නව සංස්කෘතික මිනිසෙක් නිර්මාණය කළ යුතුය. පාරවල්, ගොඩනැගිලි, බෝක්කු, පාලම් වැනි භෞතික දේවල් ඉදිකිරීම විශාල අභියෝගයක් නොවේ. ඒ සඳහා අවශ්‍ය වන්නේ මුදල් හා කාලයයි. එහෙත් ජනතාවකගේ අධ්‍යාත්මය ගොඩ නැගීම, ජනතාව සංස්කෘතික වශයෙන් ඉහළ තලයකට ගෙන ඒම පහසු කාර්යයක් නොවේ. එය ආණ්ඩුව ඉදිරියේ ඇති අනාගත අභියෝගය වේ.

භෞතික සම්පත් අතින් යම් දියුණු තලයකට රට ගෙන ඒමෙන් තොරව, ජනතාවගේ මූලික සේවාවන් දියුණු කිරීමෙන් හා පහසු කිරීමෙන් තොරව සමාජයක අධ්‍යාත්මය සංවර්ධනය කළ නොහැක. එසේම අනෙක් අතට ජනතාවගේ අධ්‍යාත්මික වර්ධනයකින් තොරව භෞතික දේවල් පමණක් ගොඩනැගීමෙන් නව සමාජයක් නිර්මාණය කිරීමටද නොහැක. මේ දෙපාර්ශවය එකිනෙක හා සම්බන්ධව ඉදිරියට යා යුතුය. ආණ්ඩුවේ අරමුණ වන්නේ එයයි.

ආණ්ඩුවට මේ ඉතාමත් ප්‍රගතිශීලී, පරිවර්තනීය වෙනස්කම් කිරීමට සිදුවන්නේ විශාල බාධාවන් මැද බව සිහි තබා ගත යුතුය. එක් අතකින් පැරණි ක්‍රමයට හුරු වූ වෙනස් වීමට අකමැති පැරණි බලවේගවල ප්‍රතිරෝධයන්ට මුහුණ දීමට ආණ්ඩුවට සිදුවන අතර අනෙක් අතින් බලය අහිමි වීම, ප්‍රභූතන්ත්‍රය බිඳවැටීම, නඩුවලට හසුවීම නිසා කෝපයටත් වියරුවටත් පත්ව සිටින විපක්ෂයේ කල්ලි කණ්ඩායම්වල ප්‍රතිවිරෝධයන්ට හා කුමන්ත්‍රණයන්ටද මුහුණ දීමට ආණ්ඩුවට සිදු වේ.

> **වර්තමාන ආණ්ඩුව ඉදිරියේ ඇති අභියෝගය වන්නේ රටේ භෞතික සම්පත් වැඩිකිරීම මගින් කරන භෞතික සංවර්ධනය පමණක් නොවේ. ඒ සමගම ජනතාවගේ අධ්‍යාත්මික සංවර්ධනයද සිදු කළ යුතුය. නව සංස්කෘතික මිනිසෙක් නිර්මාණය කළ යුතුය.**

එහෙත් ඒ ප්‍රතිවිරෝධයන්ට ආණ්ඩුව බිය වන්නේ නැත. තමන් කරන දෙය පිළිබඳ අවබෝධයෙන් හා විශ්වාසයෙන් කටයුතු කරන නිසා විපක්ෂයේ බාධා නොසලකා කටයුතු කිරීමට ආණ්ඩුවට පුළුවන. ඒ සඳහා වන නොසැලෙන ගුණය හා ස්ථාවරත්වය ආණ්ඩුව සතුව තිබේ. අනෙක් අතට පැරණි බලවේග යම් ප්‍රතිවිරෝධයක් දැක්වුවද නව වෙනස්කම්වලට හුරුවීමට හා අවසානයේ එය පිළිගැනීමට එයට සිදුවේ. ඒ පිළිබඳ සිත්කාවදින උදාහරණ දැනටමත් සමාජය තුළින් මතුවෙමින් තිබේ. විශේෂයෙන් අලුතින් හිතන නව දේශපාලන සංස්කෘතියක් අපේක්ෂා කරන තරුණ පරපුර ඉදිරියේ පැරණි බලවේගවලට වෙනස් වීමට බලකරනු ඇත.

පසුගිය මස සිදුවූ අසාර්ථක දෙදින දුම්රිය වර්ජනයේදී ප්‍රවේශ පත්‍ර කවුළු වසා තැබීම නිසා ප්‍රවේශපත්‍ර නොමැතිව දුම්රියේ ගමන් කළ තරුණ පිරිස ඊට පසුව ප්‍රවේශ පත්‍ර නොමැතිව ගමන්කළ දිනයේ පාඩුව මැකීම සඳහා පසු දිනයක ප්‍රවේශ පත්‍ර 02 බැගින් මිලදී ගන්නවා අප දුටුවෙමු. එය රටට අලුත් අත්දැකීමකි; ආදර්ශයකි. මීට පෙර ප්‍රවේශපත්‍ර නොමැතිව හොරෙන් දුම්රියේ යාම ක්‍රමයක් ලෙස පැවැතුණි. එහෙත් දැන් එය වෙනස් කරනු ලැබ තිබේ. ඒ නූතන පරපුරේ හැසිරීම විසිනි.

රටේ හිමින් වුවත් සිදුවෙමින් තිබෙන මේ වෙනස්කම් කියාපාන්නේ රට වෙනස් කිරීමේ දිසාවට කරන අවංක මැදිහත් වීම් කුමන හෝ වේලාවක පලදරන බවය. දූෂිත ප්‍රභූ පාලනයක යටත්වැසියෙකු කර තිබූ ජනයා වගකීම් සහගත පුරවැසියෙක් බවට පත් කළ හැකි බව මෙය අපට උගන්වා තිබේ. දැන් අප දකින්නේ එම අලුත් සමාජයේ පෙර නිමිතිය.

නව සමාජයක් ගොඩනැගීම හෝ නව මිනිසෙක් ගොඩනැගීම බලහත්කාරය මගින් කළ නොහැක. නව සමාජයක් නිර්මාණය කරන්නේ නව සමාජයක් ගොඩනැගීමට කැමැති නිදහස් මිනිසුන් විසිනි. ඒ සඳහා වන මගපෙන්වීම, අධ්‍යාපනය හා ආදර්ශයෙන් දීම ආණ්ඩුවේ වගකීම වේ. එම වගකීම හොඳින්ම ඉටුකිරීමට තමන් සමත් බව ආණ්ඩුව දැනටමත් පෙන්වා ඇති නිසා නව සමාජ පරිවර්තනයක් වෙනුවෙන් මෙතනින් එහාට යන ගමනද ආණ්ඩුව නිසැක ලෙසම ජයගන්නවා ඇත.

# රතු මුහුදට ලේ කඳුළු එක්කරන සුඩාන යුද්ධය



පසුගිය සියවස තුළ දීර්ඝකාලීන යුද තත්වයන් පැවති සහ අතිවිශාල ජන සංහාරයන් සිදු වූ රටක් ලෙස සුඩානය හඳුනාගත හැක. 1955 සිට 1972 කාලය දක්වා වසර 16ක් තිස්සේ පැවති යුද තත්වයෙන් මියගිය සංඛ්‍යාව ලක්ෂ 5 ඉක්මවීය. නැවත 1983 ඇරඹි යුද තත්වය අවසන් වූයේ ලක්ෂ 15-20ක පමණ ජනතාවකට දිවි අහිමි කරමිනි. එය 2005 දක්වා වසර 21කට අධික කාලයක් පැවතිණි. මෙම යුද්ධ ද්විත්වයම පදනම් වූයේ සුඩානයේ දකුණු ප්‍රදේශය පදනම් කරගනිමින් වූ අතර 2011 පැවති ජනමත විචාරණයකින් පසු 99%කට ආසන්න ඡන්ද ප්‍රතිශතයක් සහිතව දකුණු සුඩානය වෙනම රටක් ලෙස වෙන්කිරීමට තීරණය කෙරිණි. දකුණු සුඩානය වෙනම රටක් ලෙස වෙන්වී ගොස් වසර 12කට පසුව, එනම් 2023 සිට සුඩානයේ නැවත ඇරඹි යුද තත්වය එරට ජනතාව තවදුරටත් පීඩාවට පත්කරමින් ඇත. එමෙන්ම රතු මුහුද ආශ්‍රිත කලාපයේ බලය වෙනුවෙන් තරග කරන ලෝක බලවත්හුද එය සිය වුවමනා වෙනුවෙන් භාවිත කරමින් සිටිති.

1956 සුඩානය ස්වාධීන රාජ්‍යයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමෙන් පසු අද දක්වා කාලය තුළ මිලිටරි පාලකයන් (මිලිටරි කුමන්ත්‍රණ හරහා බලයට පැමිණ පසුව දේශපාලන පක්ෂ නායකයින් ලෙස ක්‍රියාත්මක වූවන්ද ඇතුළුව) නොමැතිව පාලනයන් තිබී ඇත්තේ වසර 15කටත් අඩු කාලයක් පමණි. මෑත සිටි සුඩාන නායකයින් සැලකූවිට, 1989 සිට 2019 දක්වා වසර 30ක් බලය හෙබවූ ඕමාර් අල් බෂීර් හමුදා කුමණ්ත්‍රණයකින් බලයට පැමිණ පසුව මැතිවරණ මගින් බලය හෙබ වූ අයෙක් විය. (විපක්ෂය එම මැතිවරණ වර්ජනය කළ අතර එවා හමුදා බලය යෙද වූ දූෂිත මැතිවරණ වේ) 2019දී ඔහුව බලයෙන් පහකිරීමෙන් පසු අද දක්වා එරට පාලන බලය හොබවන්නේ ජනරාල් අබ්දෙල් ෆටා අල්-බුර්හාන්ගේ නායකත්වයෙන් යුතු හමුදා කවුන්සිලයක් මගිනි.

වර්තමානයේ සුඩානයේ යුද තත්වය ඇතිවී ඇත්තේ සුඩාන සන්නද්ධ හමුදාව (SAF) සහ 'ක්ෂණික සහායක බලකාය' (RSF) අතරයි. සුඩාන සන්නද්ධ හමුදාව යනු ෆටා අල්-බුර්හාන්ගේ නායකත්වයෙන් යුතු එරට නිල සන්නද්ධ හමුදාව වේ. 'ක්ෂණික සහායක බලකාය' යනු 2013දී, එවකට සුඩාන පාලකයා වූ ඕමාර් අල් බෂීර් විසින් අර්ධ නිල හමුදාවක් ලෙස පිහිටවූ බලකායකි. 2003දී සුඩානයේ ඩාෆූර් කලාපයේ ජනතාව මධ්‍යම රජයට එරෙහිව නැගී සිටි අවස්ථාවේදී එය මර්දනය කිරීම සඳහා ඕමාර් අල් බෂීර් විසින් 'ජංජාවීඩ්' නම් අරාබි ගෝත්‍රික අශ්වාරෝහක සටන්කාමීන්ගේ සහය ලබාගන්නා ලදී. ක්ෂණික සහායක බලකාය (RSF) නමින් 2013දී අර්ධ නිල පිළිගැනීමක් ලබා දෙනු ලැබුයේ මෙම සන්නද්ධ කණ්ඩායමටයි. එසේම හිටපු ජනාධිපති බෂීර්ගේ පුද්ගලික ආරක්ෂාව සපයන කණ්ඩායමක් ලෙස ඔවුන්ව සලකන ලදී.

එහෙත් 2019දී බෂීර්ගේ පාලනයට එරෙහිව ජනතා අරගල වර්ධනය වෙද්දී RSF නායක 'හෙමෙඩ්ති' හෙවත් මොහොමඩ් හම්දාන් දගාලෝ, සුඩාන හමුදා නායක අල්-බුර්හාන් සමග එක්ව අල්-බෂීර් බලයෙන් පහකරන ලදී. ඉන් අනතුරුව සුඩානයේ පාලනය බාරගත් හමුදා කවුන්සිලයේ නායකත්වයට අල්-බුර්හාන් පත්වෙද්දී උප නායකයා ලෙස හෙමෙඩ්ති පත්කරගන්නා ලදී. ඒ සමගම RSF සෘජුවම එරට පාලන බලයට සම්බන්ධ විය. මෙම මිලිටරි පාලනය විසින් ජනතා නැගිටීමට නායකත්වය දුන් සිවිල් සංවිධාන සමග ගොඩනගා ගන්නා ලද එකඟතාවයන් මත අබ්දල්ලා හම්ඩොක් එරට අගමැතිවරයා ලෙස ඒ අවස්ථාවේදීම පත්කරගන්නා ලදී. ඉන් අනතුරුව හමුදා කවුන්සිලය සහ සිවිල් සංවිධාන එක්ව 'සංක්‍රාන්ති කවුන්සිලයක්' ඒ මොහොතේම පිහිටුවා ගත් අතර එහි නායකත්වය හොබවන ලද්දේ ද හමුදා නායක අල්-බුර්හාන් විසිනි. ඔවුන්ගේ එකඟතාවය අනුව මාස 18කින් පසු සම්පූර්ණ බලය අබ්දල්ලා හම්ඩොක්ට ලබාදිය යුතු වූ අතර 2021දී අදාල කාලය සම්පූර්ණ වීමට පෙර නැවත සිදුකල හමුදා කුමන්ත්‍රණයක් හරහා හම්ඩොක් අත්අඩංගුවට ගන්නා ලදී. ඊට විරෝධය පළකරමින් අනෙකුත් රටවල් සුඩානයට ලබාදුන් ආධාර කපාහැරීමත් සමග කෙටි කාලයකින් හම්ඩොක් නිදහස් කර නැවත අගමැති ධූරයට පත්කර ගනු ලැබුවද, එයින් දින 40කට පමණ පසු ඔහු සිය තනතුරින් ඉල්ලා අස්විය.




හම්ඩොක්ගේ ඉල්ලා අස්වීමෙන් පසු හමුදා කවුන්සිලය යටතට සමස්ත පාලන බලය ලැබීමත් සමග සුඩාන සන්නද්ධ බලකා නායක අල්-බුර්හාන් සහ ක්ෂණික සහායක බලකා නායක හෙමෙඩ්ති අතර බලපොරය සෘජුවම කරළියට පැමිණියේය. සිවිල් පාලනය සම්පූර්ණයෙන් අකර්මණ්‍ය වීමත් සමග ලෝක බලවතුන්ගෙන් එල්ල වූ බලපෑම හමුවේ නැවත සිවිල් කණ්ඩායම් පාලන බලයට සම්බන්ධ කරගැනීම සඳහා සාකච්ඡා මතු වූ අතර, එසේ සම්බන්ධ කරගැනීමේදී SAF සහ RSF සංවිධානයන් අනාගත පාලන බලය තුළ කටයුතු කරන ආකාරය පිළිබඳ බරපතළ මතභේදයන් හටගන්නා ලදී. අල්-බුර්හාන් විසින් RSF සංවිධාන සාමාජිකයින් වසර 2,3ක් තුළ සුඩාන හමුදාවට අන්තර්ග්‍රහණය කළ යුතු බව යෝජනා කිරීමත්, සිවිල් ජනාධිපතිවරයෙක් පත්වන්නේ නම් RSF සංවිධානය අවනත විය යුත්තේ අල්-බුර්හාන්ට නොව එම සිවිල් ජනාධිපතිවරයාට යන්න හෙම්ඩ්ති යෝජනා කිරීමත් මෙම මත භේදයන් සඳහා ප්‍රධාන හේතුවක් විය. එමෙන්ම ඩාර්ෆූර්හි පිහිටි රන් ආකරවල බලය හිමි RSF සංවිධානය එය අත්හැර සුඩාන නිල හමුදාවට එක්වීමට සූදානම් නොවීමද මෙම තත්වය තවදුරටත් වර්ධනය කරන ලදී. 2021 සිදු කළ හමුදා කුමණ්ත්‍රණය 'විශාල වරදක්' ලෙස RSF නායක හෙම්ඩ්ති ප්‍රසිද්ධියේ විවේචනය කරන ලදී.

මෙම මතගැටුම් අවසානයේ දෙපාර්ශවය අතර පැවති සාකච්ඡා බිඳවැටී 2023 අප්‍රේල් 12-14 දිනවලදී සුඩානයේ කාර්ටුම් අගනුවරට සහ ගුවන්තොටුපළ ඇතුළු විශේෂ ස්ථාන වෙත RSF සංවිධානය සිය හමුදා යොදවන ලදී. ඉන් පසු අප්‍රේල් 15 දින ජනාධිපති මන්දිරය, හමුදා මූලස්ථානය සහ ගුවන්තොටුපළ වෙත RSF හමුදා විසින් ප්‍රහාර එල්ල කිරීමත් සමග යුද තත්ත්වය ආරම්භ විය. එතැන් පටන් කාර්ටුම් අගනගරයේ පැවති සියලු රාජ්‍ය මධ්‍යස්ථාන පෝර්ට් සුඩාන් වෙත රැගෙන ගිය අල්-බුර්හාන් එහි සිට සිය පාලනය මෙහෙයමින් සිටියි. ඩාෆූර් කලාපයේ බලය හොබවනු ලබන්නේ RSF සංවිධානයේ නායක හෙම්ඩ්ති විසිනි.

මෙම යුදමය තත්ත්වය හමුවේ මේ වන විට 40,000ක් පමණ මියගොස් ඇති අතර 100,000කට වැඩි පිරිසක් තුවාල ලබා සිටිත. යුද තත්වය හමුවේ සෞඛ්‍ය පහසුකම් බිඳවැටීමත් සමග තවත් ජීවිත 110,000ට වැඩි ප්‍රමාණයක් අහිමිව ඇති බව එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇස්තමේන්තු කර ඇත. එරට රෝහල් ඇතුළු සෞඛ්‍ය මධ්‍යස්ථානවලින් 80%ක් මේ වන විට වසා දමා ඇත. මෙතෙක් ආර්ථිකයට සිදුව ඇති හානිය ඩොලර් බිලියන 100 ඉක්මවා ඇති බවට ඇස්මේන්තු කර ඇති අතර එරට ආර්ථිකය 40%කින් පමණ හැකිළී ඇත. උද්ධමනයද 200% ඉක්මවා ඇති අතර කෘෂි වගාවන් බොහොමයක් යුද්ධය නිසා සම්පූර්ණයෙන් නතර වී ඇත. මිලියන 11කට අධික ජනතාවක් සිය නිවෙස් අතහැර පලාගොස් අවතැන් වී සිටින අතර ඉන් මිලියන 3ක් පමණ අසල්වැසි රටවලට සංක්‍රමණය වී ඇත. මේ වන විට සමස්ත සුඩාන ජනගහනයෙන් 50% ඉක්මවූ ප්‍රමාණයක් ආහාර හිඟය සමග උග්‍ර කුසගින්නෙන් පෙළෙන බවද ජාත්‍යන්තර සංඛ්‍යාලේඛන පවසයි. සරණාගත කඳවුරුවල පවතින සාගත තත්වය නිසා දිනකට දරුවන් සිය ගණනක් මිය යන බවද වාර්තා වී ඇත. එමෙන්ම ඩාෆූර් කලාපයේ ජීවත්වන අරාබි නොවන 'මසාලිට්' ගෝත්‍රිකයින් ඉලක්ක කරගත් වාර්ගික සංහාරයක් සිදුවෙමින් පවතින බවටද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ වාර්තා විසින් පෙන්වා දී ඇත.

සුඩානයේ අගනුවර ඇතුළු කලාපයක් හෙම්ඩ්ති විසින් පාලනය කරනු ලැබුවද ජාත්‍යන්තර වශයෙන් සියලුම රටවල් තවමත් සුඩානයේ පාලකයා ලෙස පිළිගනු ලබන්නේ අල්-බුර්හාන් වේ. සුඩානයේ කාර්ටුම් අගනුවර පැවති තානාපති කාර්යාල පවා පෝර්ට් සුඩාන් වෙත රැගෙන ගොස් ඇත. කෙසේ නමුත් RSF නායක හෙම්ඩ්ති පවසන්නේ සුඩානයේ පවතින ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනය බිඳ දමා ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ඇතිකිරීම සිය ඉලක්කය වන බවයි. RSF සංවිධානය විසින් පාලනය කරන ඩාෆූර් කලාපය වෙනම රටක් ලෙස වෙන්කිරීමට හෙම්ඩ්ති මෙතෙක් ඉල්ලා නැති අතර ඔවුන්ගේ ඉලක්කය වන්නේ සමස්ත සුඩානයේම පාලන බලය ලබාගැනීම බව ඔහු පවසා ඇත. නිල වශයෙන් RSF සංවිධානයේ පාලන බලය පිළිගනු නොලැබුවද උගන්ඩාව, ඉතියෝපියාව, කෙන්යාව, ඝානාව, රුවන්ඩාව සහ ජිබුටි යන රටවල රාජ්‍ය නායකයින් විසින් හෙම්ඩ්ති මුණගැසී සාකච්ඡා පවත්වා ඇත.

මෙම යුද්ධයේදී RSF සංවිධානයට ඩ්‍රෝන යානා ඇතුළු අවි ආයුධ සපයන බවට එක්සත් අරාබි එමීර් රාජ්‍යයට චෝදනා එල්ල වී ඇත. ඒ අතර ඉරානය සුඩානයේ අල්-බුර්හාන් පාලනය වෙත උසස් තාක්ෂණයෙන් යුත් යුද උපකරණ ලබා දී ඇත. එසේම අසල්වැසි ඊජිප්තුවද අල්-බුර්හාන් පාලනය ආරක්ෂා කිරීමට සෘජුවම කටයුතු කරමින් සිටියි. මේ සියලු රටවලට සිය මැදිහත් වීම් සඳහා ප්‍රධාන හේතුව වී ඇත්තේ යුරෝපය සහ ආසියාව යා කෙරෙන ප්‍රධාන නාවික ගමන් මාර්ගය වූ රතු මුහුදේ ආධිපත්‍යය තහවුරු කරගැනීමයි.

සෞදි අරාබිය සහ එක්සත් ජනපදය එක්ව දෙපාර්ශවය වෙනුවෙන් ජෙඩාහිදී සාම සාකච්ඡා ආරම්භ කර ඇත. එක්සත් ජනපදය, එක්සත් රාජධානිය මෙන්ම යුරෝපා සංගමය විසින් යුද අපරාධ සඳහා වගකිව යුතුයැයි පැවසෙන දෙපාර්ශවයේම නායකයින් සඳහා මෙන්ම RSF සංවිධානයට අවි ආයුධ සපයන සමාගම්වලට එරෙහිව සම්බාධක පනවා ඇත. චීනය ප්‍රකාශ කර ඇත්තේ තෙවන පාර්ශවයක මැදිහත්වීමකින්

11 වැනි පිටුවට

## ජර්මනිය - බර්ලිනයේ ජය 'වමට'




1989 අවසානයේදී නැගෙනහිර ජර්මනියේ සමාජවාදී පාලනය බිඳවැටීමෙන් පසු ප්‍රථම වතාවට බර්ලින් ප්‍රාන්ත මැතිවරණයේ වැඩිම ඡන්ද ප්‍රතිශතයක් ලබාගැනීමට 'ඩී ලින්කේ' (The Left - වම) පක්ෂය සමත්ව ඇත. ඒ පසුගිය සැප්තැම්බර් 20 පැවති ප්‍රාන්ත මැතිවරණයෙන් 25.7%ක ප්‍රතිශතයක් සහ ආසන 159න් 47ක් ජයග්‍රහණය කරමිනි.

කෙසේ නමුත් බර්ලිනයේ පාලන බලය පිහිටුවීමට නම් ආසන 80ක් අවශ්‍ය වේ. එම නිසා එරට මධ්‍ය වාමාංශික පක්ෂ ලෙස සැලකෙන ආසන 22ක් ලබාගත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය සහ ආසන 26ක් ලබාගත් හරිත පක්ෂය සමග සහාග පාලනයක් පිහිටුවීම සඳහා ඔවුන් විසින් සාකච්ඡා ආරම්භ කර ඇත.

## පෝලන්තය - ස්වේච්ඡා හමුදා බලඇණි වර්ධනය කර



පෝලන්තයේ පැවති අනිවාර්ය හමුදා සේවය 2008 සිට අත්හිටුවන ලදී. නමුත් 2022දී රුසියන්-යුක්‍රේන යුද්ධය ඇරඹීමත් සමග එය නව ආකාරයකින් ක්‍රියාත්මක කරමින් 'ස්වේච්ඡා හමුදා සේවය' නම් නව ක්‍රමයක් හඳුන්වාදී ඇත. ඒ අනුව වයස අවුරුදු 18ට වැඩි ඕනෑම පෝලන්ත පුරවැසියෙකුට දින 27ක මූලික හමුදා පුහුණුවකින් පසු ස්වේච්ඡා සංචිතයට එක්වෙමින් සාමාන්‍ය ජීවිතය ගතකළ හැක.

මෑත කාලයේදී එරට අගමැති ඩොනල්ඩ් ටුස්ක් ඇතුළු නායකයින් රුසියාවෙන් එල්ල විය හැකි ප්‍රහාර සම්බන්ධයෙන් දිගින් දිගටම අනතුරු හැඟවීමත් සමග තරුණ තරුණියන් මෙම ස්වේච්ඡා බලකායට සම්බන්ධ වීම වේගයෙන් වර්ධනය වී ඇත.

## ප්‍රංශය - රාජ්‍ය සේවකයින් උද්ඝෝෂණයේ



වැටුප් වැඩිකිරීම, අයවැය මගින් රාජ්‍ය ප්‍රතිපාදන කප්පාදුවට එරෙහි වීම, රාජ්‍ය සේවයේ මානව සහ භෞතික සම්පත් ඉහළ දැමීම ආදී ඉල්ලීම් පදනම් කරගනිමින් සැප්තැම්බර් 29 දින ප්‍රංශයේ නගර 170ක පමණ විරෝධතා සංවිධානය කර තිබිණ. අධික උෂ්ණත්වය සමග නිතර පැනනගින ලැව්ගිනි නිවීම සඳහා අවශ්‍ය සම්පත් හිඟකම පදනම් කරගනිමින් ගිනි නිවන භටයන්ද විශාල ලෙස උද්ඝෝෂණයන්ට එක්ව තිබීම විශේෂයක් විය.

ඊට අමතරව ගුරුවරුන් සහ පාසල් කාර්ය මණ්ඩල, රෝහල් සේවකයින් ඇතුළු දහස් ගණනක් උද්ඝෝෂණ සඳහා එක්ව සිටි අතර එම ඉල්ලීම් සඳහා සහය පළ කරමින් පාසල් සහ විශ්වවිද්‍යාල සිසුන්ද එක්ව තිබිණි.

## එක්සත් ජාතීන් - සයිබර් අපරාධ වැළැක්වීමේ ගිවිසුමකට



ගෝලීය වශයෙන් සිදුවන සයිබර් තර්ජන මැඩපැවැත්වීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්පාදනය කළ පළමු බහුපාර්ශවීය ගිවිසුම සඳහා පසුගිය සැප්තැම්බර් මාසයේදී අත්සන් තබන ලදී. 2024දී අවසන් වශයෙන් කෙටුම්පත් කර අනුමත කරගන්නා ලද මෙම ගිවිසුම සඳහා ඉන්දියාව, ඉන්දුනීසියාව, නෙදර්ලන්තය, නෝර්වේ ඇතුළු රටවල් ගණනාවක් අත්සන් තබා ඇත.

ඩිජිටල් සාක්ෂි හුවමාරුව, ගෝලීය සයිබර් අපරාධ මැඩලීම (සයිබර් මූල්‍ය වංචා, සයිබර් ප්‍රහාර අපරාධ ලෙස නීතිගත කිරීම), සයිබර් අපරාධයකදී රටවල් අතර 24/7, ක්ෂණික තොරතුරු හුවමාරුව සඳහා විමර්ශන ජාලයක් පිහිටුවීම මෙහි මූලික කරුණු වේ.

# ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට



බංකොලොත් වී දුප්පත්භාවයේ පතුලටම ඇද වැටී තිබූ රටක බලය ලබාගෙන එම ලබාගත් බලය උපයෝගී කරගෙන කෙටි කාලයකින් එහි ආර්ථිකය ස්ථාවර කරගත්තේ ජාතික ජන බලවේග ආණ්ඩුව බව දේශීය මෙන්ම ජාත්‍යන්තර ආර්ථික විශේෂඥයින්ද පිළිග න්නා කාරණයකි. එලෙසම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මෙන්ම අනෙකුත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනද මෙම තත්වය පිළිගෙන තිබේ. පසුගිය වසර දෙක තුළ දළ දේශීය නිෂ්පාදනයේ ඉහළ යාම, එයට සාපේක්ෂව ඒක පුද්ගල ආදායම ඉහළ යාම, අපනයන ආදායම ඉහළ යාම, සේවා වියුක්ති අනුපාතය පහළ යාම, විදේශ සංචිත ඉහළ යාම, විදෙස් ශ්‍රමික ප්‍රේෂණ ඉහළ යාම, බදු ආදායම ඉහළ යාම, සදාකාලික රෝගයක් ලෙස පැවති අයවැය හිඟය වෙනුවට අයවැය අතිරික්තයක් නිර්මාණය කර ගැනීම වැනි ප්‍රධාන ආර්ථික සංරචක සියල්ලම යහපත් ලෙස වර්ධනය වීම පසුගිය වසර දෙකක් වැනි කෙටි කාලයකදී රටක් ලෙස අප ලබාගත් විශාල ආර්ථික ජයග්‍රහණයි. ආර්ථික ජයග්‍රහණ ලබාගැනීම පමණක් ප්‍රමාණවත් නොවන අතර එම ආර්ථික ජයග්‍රහණ ජනතාව අතරට ගලා ගියේ කෙසේද යන්නත් ඉතා වැදගත් වේ.

අපගේ රජයේ ප්‍රධාන අරමුණක් වන්නේ "පොහොසත් රටක ලස්සන ජීවිතයක්" සියලු දෙනාටම ලබාදීමයි. ජනතාවට ලස්සන ජීවිතයක් ලබා දීමට නම් ඒ රට ආර්ථික වශයෙන් පොහොසත් විය යුතුය. දියුණු ආර්ථිකයකින් තොරව රටක ජනතාවට හොඳ ජීවන තත්වයක් ලබාදිය නොහැක. ආර්ථිකය දියුණු වන ප්‍රමාණයට සාපේක්ෂව බහුතර ජනතාවගේ ජීවන තත්වයද පොදුවේ ඉහළ යා යුතුය. ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට නොලැබෙන, බහුතර ජනතාවකට හොඳ ජීවන තත්වයක් අත්කර නොදෙන ආර්ථිකයක් කෙතරම් පොහොසත් වුවද එවැනි ආර්ථිකයකින් ජනතාවට පලක් නැත. මෙවැනි පොහොසත් ආර්ථිකයන්ට උදාහරණ ලෝකය පුරා ඕනෑ තරම් ඇති අතර ඉතා ධනවත් යයි කියාග න්නා සමහර රටවල බොහෝ දුප්පතුන් නිර්මාණය වන අවස්ථා කොතෙකුත් අපි දැක ඇත්තෙමු.

ආණ්ඩුවකට ආර්ථිකය හැසිරවීම මගින් තම රටේ ජනතාවට ප්‍රතිලාභ දිය හැකි ක්‍රම දෙකක් ඇත. එය ඍජු ප්‍රතිලාභ සහ වක්‍ර ප්‍රතිලාභයි. ඍජු ප්‍රතිලාභ යනු ඒවා තමන්ට පෞද්ගලිකව ලැබෙන සහ දැනෙන දේවල්ය. උදාහරණ ලෙස විශ්‍රාම වැටුප, ආණ්ඩුවෙන් ලැබෙන මූල්‍ය ආධාර, නිවාස, පොහොර සහනාධාර සහ වෙනත් සහනාධාරයි. මේවා තමන්ට ඍජුවම ලැබෙන නිසා ජනතාවගේ වැඩි කැමැත්ත ඇත්තේ මෙවැනි ඍජු ප්‍රතිලාභවලටය. රටක අධ්‍යාපනය දියුණු වීම, සෞඛ්‍යය දියුණු වීම, යටිතල පහසුකම් දියුණු වීම, නීතියේ ස්වාධිපත්‍ය ස්ථාපිත කිරීම, පුද්ගල නිදහස සමාජයට ලැබෙන වක්‍ර ප්‍රතිලාභ වන අතර ඒවා තනි පුද්ගලයින්ට කොපමණ ලැබුණාදැයි වටිනාකමක් ආරෝපණය කර පැවසිය නොහැක. ජාතික ජන බලවේග ආණ්ඩුව බලය ලබාගත් මොහොතේ සිට මෙම ක්‍රම දෙක මගින්ම ජනතාවට ප්‍රතිලාභ ලබාදී ඇත. අප වැනි දරිද්‍රතාවයේ පතුලේ සිටි රටක් ඉදිරියට යාමේදී මෙම ක්‍රම දෙකේම සම්මිශ්‍රණයක් අත්‍යවශ්‍ය වේ. එයට හේතු දශක ගණනක් පැවති දුප්පත්කම වසරකින් දෙකකින් රටකින් තුරන් කිරීම කිසිදා කළ හැකි කාර්යයක් නොවේ. එහෙත් එසේ දුප්පත්කමට පත්වූ ජනතාව ඉහත ක්‍රම මගින් නැවත සාමාන්‍ය තත්වයට පත්කිරීම රජයේ වගකීමකි. ආර්ථික හැකියාව වර්ධනය කරගන්නා තෙක් සහනාධාර දීම සහ උදව් කිරීම කිසියම් කාලයක් කළ යුතු වේ. ඒ සඳහා රජයේ මහා භාණ්ඩාගාරයට ප්‍රමාණවත් ආදායමක් ලැබිය යුතු අතර එය එම ආදායම මනා ලෙස කළමනාකරණය කරගැනීමටද රජයට හැකි විය යුතුය.

## ප්‍රාග්ධන වියදම් ඉහළ දැමීම

ආණ්ඩුවේ වියදම් ප්‍රධන වශයෙන් කොටස් දෙකකට එනම් පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම ලෙස බෙදා දක්වයි. ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට ගලාගෙන යාමට නම් රාජ්‍ය ආදායම වැඩි කරගත යුතු අතර එය ඉහත ආකාරයට ආයෝජනය කළ යුතුය. ලංකාවේ පසුගිය වසර තුනෙහි මෙම වියදම බෙදී ගිය ආකාරය පහතින් දැක්වේ.

ඒ අනුව 2025 වසරට

| වසර | පුනරාවර්තන වියදම (රු.බි.) | ප්‍රාග්ධන වියදම (රු.බි.) |
|---|---|---|
| 2024 | 5,339 | 790 |
| 2025 | 5,530 | 998 |
| 2026 | 5,722 | 1,400 |

සාපේක්ෂව 2026 වසරේ ප්‍රාග්ධන වියදම් සඳහා ආයෝජනය 40%කින් ඉහළ දමා ඇත. ප්‍රාග්ධන වියදම් ඉහළ දැමීමෙන් රජය බලාපොරොත්තු වන්නේ ආර්ථිකයේ වර්ධනයට අවශ්‍ය නිෂ්පාදන අංශය සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමය. එමගින් ආර්ථිකයේ රැකියා අවස්ථා නිර්මාණය වීමත්, ජනතාව අතට මුදල් ගලා ඒමත් නිසා ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ යාමක් සිදුවේ. පුනරාවර්තන වියදම් ඉහළ දැමීම තුළ ඍජු පුද්ගල ප්‍රතිලාභ ඉහළ යා හැකි නමුත් ආර්ථික සංවර්ධනයට ඍජුව දායක වන්නේ ප්‍රාග්ධන වියදම්වල ඉහළ යාමයි. රටක ආයෝජන ඉහළ යන ප්‍රමාණයට සාපේක්ෂව එරටෙහි ආර්ථික සංවර්ධනය ඉහළ යන නිසා අප වැනි රටවල් ප්‍රධාන වශයෙන් කළ යුත්තේ උපරිම ලෙස ප්‍රාග්ධන වියදම් ඉහළ නංවා ගැනීමයි. එවිට ආර්ථිකයේ ප්‍රතිලාභ වක්‍ර ආකාරයෙන් ජනතාවට ලැබේ. ලෝකයේ බොහෝ දියුණු වෙමින් පවතින රටවල් අනුග මනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තිය වන්නේ මෙලෙස ප්‍රාග්ධන වියදම් ඉහළ නංවා ගැනීමයි. මෙලෙස ආණ්ඩුවේ වියදම් ඉහළ නංවා ගැනීම තුළ අනෙකුත් අත්‍යවශ්‍ය අංශයන්හි කරන ලද ආයෝජනය ගැනද සලකා බැලිය යුතුය. ඒ අතර අධ්‍යාපන , සෞඛ්‍ය සහ මහාමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය ඉතා වැදගත් වේ. විශේෂයෙන්ම පසුගිය රජයන් විසින් අධ්‍යාපනයට සහ සෞඛ්‍යට දරන ලද වියදම් සීමා කිරීම නිසා ආර්ථිකයේ ප්‍රතිලාභ පොදු ජනයාට ගලායා හැකිව තිබූ ප්‍රධාන අංශ දෙකක් වැසී ගියේය. ඒ හේතුව නිසාම ජනතාවට තම ආදායමෙන් විශාල කොටසක් අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට වියදම් කිරීමට සිදු විය.

## අර්බුදය හමුවේ ජනතාවට සහන සැලසීම

වර්තමාන රජය ජනතාව මුහුණ දුන් සියලු ආපදා හමුවේ එයට මැදිහත්වී ජනතාවට සිදුවූ අලාභ වෙනුවෙන් ඔවුන්ගේ ජන ජීවිතය යථා තත්වයට පත්කිරීමට අවශ්‍ය සහන සැලසීය. විශේෂයෙන්ම දිට්වා සුළි කුණාටුවෙන් අගතියට පත්වූ සියලු පාර්ශ්වයන්ට රජය වෙනුවෙන් ලබා දිය හැකි උපරිම සහනයන් ලබාදුන්නේය. ගං වතුරෙන් සුළු අලාභයන් පවා සිදුවූ අයට රුපියල් 25,000ක වන්දි මුදලක් ලබාදුන් අතර තාවකාලික නිවාස අහිමි වූවන්ට පවා ස්ථිර නිවාස ඉදිකර දෙනු ලැබිණි. එලෙසම කර්මාන්ත ශාලා, ව්‍යාපාරික ආයතන, ගොවිපොළවල් සඳහාද අදාළ වන්දි මුදල් ලබාදෙමින් ආර්ථිකයේ එතෙක් අත්පත් කරගෙන තිබූ ප්‍රතිලාභ අපහසුවකින් තොරව ජනතාව අතට පත්කෙරිණි. මෙම ස්වභාවික ව්‍යසනය නිසා ශ්‍රී ලංකා රජය විදෙස් රටවලට ණය නොවූ අතර එසේ නොකිරීමට බලපෑ හේතුව වූයේ රට විසින් කෙටි කාලයේදී අත්පත් කරගෙන තිබූ ආර්ථික සංවර්ධනයයි.

අනෙක් අතට මැදපෙරදිග කලාපයේ පවතින යුදමය තත්වය යටතේ ආනයන අපනයන වෙළඳාමටත් ඛනිජ තෙල් මිලටත් විශාල බලපෑමක් එල්ල විය. විපක්ෂය බලාපොරොත්තු වූයේ මෙම තත්වය කළමනාකරණය කරගැනීමට නොහැකිව තෙල් පෝලිම් සහ ගෑස් පෝලිම් නැවත වරක් නිර්මාණය වී ආර්ථික අර්බුදයක් නිර්මාණය වනු ඇති බවය. එහෙත් ආර්ථිකයේ ලබා තිබූ ස්ථාවරභාවය ප්‍රයෝජනයට ගෙන සමස්ත ආර්ථිකයට ඇති විය හැකිව තිබූ අවදානම අවම කර ගැනිණි. ජනතාව මුහුණ දීමට නියමිතව තිබූ පීඩාවෙන් ඔවුන් මුදවා ගැනිණි. මෙම යුදමය තත්වය නිසා ලෝක වෙළඳපොලෙහි තෙල් මිලට සිදුවන බලපෑම ජනතාව මතට කඩා පාත්වීමට රජය කටයුතු නොකළ අතර එහි බරපැණෙහි විශාල කොටසක රජය දරා ගත් අතර එමගින් ජනතාවට විශාල සහනයක් සැලසුණේය. මෙම බලපෑම අවම කිරීම වෙනුවෙන් රජය විසින් 2026 සැප්තැම්බර් මාසය වනවිට රුපියල් මිලියන 103,000ට වැඩි මුදලක් වියදම් කර තිබුණු අතර එය පහත පරිදි වේ.

| | රු.මිලියන |
|---|---|
| පොහොර සහනාධාරය | 5,500 |
| ධීවර සහනාධාරය | 3,440 |
| අස්වැසුම සහනධාරය ඉහල දැමීම | 8,200 |
| විදුලි ගාස්තු ප්‍රතිපුරනය කිරීම | 32,200 |
| ඉන්ධන සහනාධාරය | 56,600 |

මෙලෙස ජනතාවට දැරීමට නියම වී තිබූ මිලක් මහා භාණ්ඩාගාරය දරා ගැනීමට හැකි වූයේද ලබාගෙන තිබූ ආර්ථික වර්ධනය නිසාය. මෙය ජනතාවට නොදැනෙන එහෙත් ආර්ථිකයේ ප්‍රතිලාභ ඔවුන් වෙතට විශාල ලෙස ඇදී ගිය අවස්ථාවකි.

සෞඛ්‍ය අමාත්‍යංශය මගින් ආරම්භ කර ඇති රෝහල් පද්ධතිය නවීකරණය කිරීමේ වැඩපිළිවෙළත්, අධ්‍යාපන අමාත්‍යංශය මගින් අරඹා ඇති පාසල් සහ විශ්වවිද්‍යාල සඳහා යටිතල පහසුකම් සැපයීමත් දියුණු ප්‍රවාහන පහසුකම් මගී ජනතාවට ලබාදීමත් ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාව අතරට ගෙනයාමට රජය කටයුතු කරනු ලබන තවත් ප්‍රධාන ව්‍යාපෘතීන් කිහිපයකි. ඒ අනුව අපගේ රජය විසින් ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාව අතරට ගෙන යාම සම්බන්ධයෙන් දක්වා ඇත්තේ දියුණු මැදිහත්වීමකි. එය ජනතාවාදී ආණ්ඩුවක මූලික වගකීමක් වන අතර සමාජ සංවර්ධනයේ ඉදිරි පිම්මකි.

> මැදපෙරදිග කලාපයේ පවතින යුදමය තත්වය යටතේ ආනයන අපනයන වෙළඳාමටත් ඛනිජ තෙල් මිලටත් විශාල බලපෑමක් එල්ල විය. විපක්ෂය බලාපොරොත්තු වූයේ මෙම තත්වය කළමනාකරණය කරගැනීමට නොහැකිව තෙල් පෝලිම් සහ ගෑස් පෝලිම් නැවත වරක් නිර්මාණය වී ආර්ථික අර්බුදයක් නිර්මාණය වනු ඇති බවය. එහෙත් ආර්ථිකයේ ලබා තිබූ ස්ථාවරභාවය ප්‍රයෝජනයට ගෙන සමස්ත ආර්ථිකයට ඇති විය හැකිව තිබූ අවදානම අවම කර ගැනිණි.



"මිනිසා මාලිගාවකදී හා පැල්පතකදී වෙනස් ආකාරයෙන් සිතයි. සාගින්න නිසා, දුක්ඛිත තත්වය නිසා ඔබට ඔබේ සිරුර තුළ පෝෂණය සඳහා දෙයක් නොමැති නම්, ඒ ආකාරයෙන්ම, ඔබේ ඔළුවේ, ඔබේ මනසේ සහ හදවතේ සදාචාරය පෝෂණය සඳහා දෙයක් නොමැත."

**ලුද්විග් ෆෙබාහ්ග්**



# නීතිය සහ සදාචාරාත්මක අගයන්
# සුරකින සමාජ වටපිටාවක්!

ඔක්තෝබර් මාසය උදාවන්නේම ලෝකයේ අතිශය අවධානයට ලක් වියයුතු දරුවන් සහ වැඩිහිටියන් පිළිබඳ කතාබහ කරන දිනයකිනි. ඒ ලෝක ළමා දිනය සහ වැඩිහිටි දිනය ඔක්තෝබර් 1 වෙනිදාට යෙදී තිබීම හේතුවෙනි. වැඩිහිටියන් හා ළමුන් සමාජයේ අනාරක්ෂිත වූ කාලවකවානුවක ඔවුන්ගේ ජීවිත සුරක්ෂිත කරනු වස් ආණ්ඩුව බොහෝ ක්‍රියාමාර්ග ගනිමින් හිඳින මොහොතක වක්‍රාකාරයෙන් සමහර වැඩිහිටියන්ගේ ක්‍රියා කලාපයන් තුළින් ළමා මනසට වන අහිතකර බලපෑම පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් යැයි හැඟෙයි.
"මනසින් සවිමත්- දරුවන් පොහොසත්" තේමාව කර ගනිමින් මෙවර ලෝක ළමා දිනය ලොව පුරා සමරනු ලබයි. ඕනෑම අභියෝගයකට මුහුණ දීමේ හැකියාව ඇති ආකල්පවලින් පොහොසත් සහකම්පනය සහිත දරු පරපුරක් හෙට දිනයේ මෙරට බිහිවනු දැකීම අපගේ අරමුණයි. රටේ අධ්‍යාපනය දිශාභිමුඛ වන්නේ ද මේ අරමුණ පෙරදැරිකොට ගෙනය.
නමුත් වර්තමානයේ සමාජයේ පවතින ප්‍රශ්නයක් දරුවන් කෙරෙහි අයහපත් අන්දමින් බලපාන්නට හේතු විය හැකිය. රටේ නීතිය නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වීම තුළ මෙතෙක්  මේ රට තම පෞද්ගලික දේපළක් සේ සලකා කටයුතු කළ, අයථා ලෙස වත්කම් උපයාගත් දූෂණයෙන් වංචාවෙන් මව්බිමේ සාරය උරාබී තම පැවැත්ම තහවුරු කරගත් පිරිසක් කලබල වී සිටී. තමන්ට ද නුදුරු අනාගතයේ දී ම කළකම් පළ දීමට නියමිත බැව් වටහා ගත් තම තම කිල්ලෝටවල හුණු බිඳක් හෝ ඇති විපක්ෂයේ චෞර වළල්ල සමාජය ඉදිරියේ වීරයන් සේ උළුප්පා දැක්වීමට උත්සාහ ගනිමින් හිඳියි.සොරුන් වීරයන් කිරීමේ මෙකී  උත්සාහය  ළමා පරපුරේ අනාගතයට ඉතා අහිතකර ලෙස බලපාන්නට ඉඩ තිබේ.
"ළමා මනස නොලියූ පිටුවක් වැනිය. එහි වරක් ලියූ කළ මැකිය ද නොහේ" වරෙක ජෝන් ලොක් නම් දාර්ශනිකයා විසින් මෙසේ පවසා තිබේ.  කුඩා අවදියේ දී තමන් අත්දකින දේ දරුවන්ගේ මනසෙහි නොමැකෙන ලෙස සටහන් වන බවයි.
වර්තමාන දේශපාලන හා සමාජීය ක්ෂේත්‍රය දෙස බලන විට, විවිධ තරාතිරමේ වංචා, දූෂණ සහ නීති විරෝධී ක්‍රියාවලට සම්බන්ධ වූ පුද්ගලයන්ගේ ප්‍රතිරූපය පවිත්‍ර කරමින්, ඔවුන් නායකයන් හා වීරයන් ලෙස සමාජගත කිරීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. ඇතැම් වැඩිහිටින් විසින් කරනු ලබන මෙම බලපෑම, ඔවුන් අනුගමනය කරන නැගී එන ළමා හා තරුණ පරපුර කෙරෙහි ඇති කරන්නේ අතිශය අහිතකර සහ භයානක බලපෑමකි.
ළමයින් ස්භාවයෙන්ම තමාට වඩා වැඩිහිටි පුද්ගලයන්ගේ සහ නායකයන්ගේ හැසිරීම් අනුකරණය කරයි. නීතිය හසුරුවන, මහජන මුදල් අවභාවිත කරන හෝ වංචා පදනම් කරගත් පුද්ගලයන් සමාජයේ ඉහළම ගෞරවයට පාත්‍ර වන බව දකින විට, ළමුන් තුළ රජයන්, නීතිය සහ සමාජ සදාචාරය පිළිබඳ ඇති ගෞරවය පළුදු වේ. "වංචාව සහ දූෂණය යනු සාර්ථකත්වයට යන කෙටි මගක්" යන්න ඔවුන්ගේ සිත් තුළ තැන්පත් වීමට මෙය ප්‍රධාන හේතුවක් වේ.
සත්‍යවාදී බව, සාධාරණත්වය සහ මහන්සියෙන් යමක් උපයා ගැනීම වැනි මූලික මානුෂීය අගයන් වෙනුවට බලය, මුදල් සහ කපටිකම ජයග්‍රහණයේ නිර්ණායක ලෙස කුඩා මනස් තුළ ස්ථාපිත වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස අනාගත නායකයන් ලෙස ගොඩනැගීමට සිටින දරුවන්, සාධාරණ සමාජීය අගයන්ගෙන් ඈත් වී තමන්ගේ පෞද්ගලික වාසිය උදෙසා ඕනෑම වැරදි ක්‍රියාවක් සාධාරණීකරණය කිරීමට පෙළඹේ.
වංචාකරුවන් වීරයන් ලෙස සැලකෙන සමාජයක, අනාගතයේදී නීතියට ගරු කරන සහ ප්‍රතිපත්තිගරුක නායකත්වයක් බිහිවීම වැළකී යයි. දේශපාලනමය හෝ සමාජීය වශයෙන් එවැනි පුද්ගලයන්ට රැකවරණය ලබා දීම සහ ඔවුන්ව ඉහළින් තැබීම මගින් මුළු සමාජ පද්ධතියම බිඳවැටීමට ලක්වන අතර, එහි අහිතකර විපාක විඳීමට සිදුවන්නේ අනාගත පරම්පරාවටයි.
ළමා පරපුර යහපත් මගකට යොමු කිරීමේ වගකීම ඇත්තේ වර්තමාන වැඩිහිටියන් සහ දේශපාලන නායකත්වය සතුවය. දූෂණයට හා වංචාවට එරෙහිව සැබෑ ලෙසම පෙනී සිටීමත්, සැබෑ චරිතවත් පුද්ගලයන් දරුවන්ට ආදර්ශ ලෙස පෙන්වා දීමත් වර්තමානයේ අත්‍යවශ්‍යයෙන්ම සිදුවිය යුත්තකි. ළමා පරපුරේ අනාගතය සුරක්ෂිත කළ හැක්කේ නීතියේ ආධිපත්‍යය සහ සදාචාරාත්මක අගයන් සුරකින සමාජ වටපිටාවක් නිර්මාණය කිරීමෙන් පමණි.
ඒ සඳහා දිවිහිමියෙන් කැපවන ආණ්ඩුවක් දැන් අපට තිබේ. ඒ ආණ්ඩුව සුරැකීමට ශක්තිමත් පවුරක් ලෙස ගොඩනැඟීම කාන්තාවන් ලෙස අපගේ වගකීමයි.

## එකම අහසට පියාසලනට අලුත් විහඟුන් පෙළට නැගුණා!

දුර කඳු ශිඛර මතුයෙත්
අලුත් පැළ හෙමි හෙමින් වැඩුණා
 මිලින වන්නට නියමිත වූ මල්
ඉරට පෙර හිනැහෙමින් උන්නා

පාට බොඳ වී හඬා  වැළපුන
හීන නෙක පැහැ තාල මැවුණා
අඳුර තුළ
 මිය යන්න ඉඩ තිබූ
තරුත් හරි අරුමැසි ව දිලුණා

දිරාගිය වැඩිහිටි උකුළුවල
පිපාසිත  පොඩි කැකුළු වෙළුණා
සතුට   සැනසුම අහිමි අහසක
පෙරඹරින් හිරු කිරණ  නැගුණා...
එකම අතකට පියාසලනට
අලුත් විහඟුන් පෙළට නැගුණා...

## ජන මතය!



සැප්තැම්බර් 27 දිනට යෙදී තිබුණු 2026 ලෝක ළමා දින ජාතික සතියේ තෙවන දිනය සනිටුහන් කරමින් ආයතනගත දරුවන් වෙනුවෙන්  වෘත්තීය නිපුණතා මාර්ගෝපදේශ වැඩසටහන ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සහයෝගීතාවයෙන් පැවැත්විණි.
ආයතනගතව සිට වයස අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් අනතුරුව සමාජගත වන අවස්ථාවේදී දරුවන්ට මුහුණ දීමට සිදුවන වෘත්තීය නිපුණතා මදිකම, වෘත්තීය සුදුසුකම් සැපිරීමේ අපහසුතාව, රැකියා අවස්ථා සපයා ගැනීමේ අපහසුතාවය වැනි අභියෝග රැසක් සඳහා විසඳුම් සෙවීම මෙහි අරමුණ විය.
මෙම වැඩ සටහන සඳහා කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය සරෝජා පෝල් රාජ් සහෝදරිය, අමාත්‍යාංශ ලේකම්තුමිය සහ  ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා ඇතුළු පිරිසක් සහභාගි විය.

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල පදනම් කරගනිමින් දරුවන් දණ්ඩණයට ලක් කිරීම, මානසිකව හිංසනයට ලක්කිරීම මෙන්ම විභාග ප්‍රතිඵල මත පදනම්ව දරුවන් අපහසුතාවයට පත්වන අයුරේ ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සිදු කිරීමෙන්ද වළකින ලෙස කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය ප්‍රකාශ කර සිටී.
  එමෙන්ම ඉහත ආකාරයෙන් කටයුතු කිරීම ළමා හිංසනය යටතේ දඬුවම් ලැබිය හැකි වැරදි වන බැවින් එසේ සිදු කරන්නන් හට උපරිම නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදු කරනු ලබන බවද එම  අමාත්‍යාංශය අවධාරණය කර තිබේ.

කොරියා ජනරජයේ සෝල් නගරයේදී පසුගිය 17දා කාන්තාවන්ගේ ආර්ථික සවිබලග ැන්වීම සඳහා රැකවරණ පද්ධති පරිවර්තනය කිරීම පිළිබඳ කලාපීය  සමුළුවක් පැවත්විණි. එම හමුව  සඳහා කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යය නාමල් සුදර්ශන සහෝදරයා සහභාගි විය.
ආසියානු සහ පැසිෆික් කලාපයේ රටවල් එක්කර ගනිමින් අත්දැකීම් හුවමාරු කර ගැනීමට, හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීමට සහ රැකවරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සාමූහික ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යාමට මෙම කලාපීය හමුව වැදගත් වේදිකාවක් බවද නියෝජ්‍ය අමාත්‍යවරයා එහිදී පෙන්වා දුන්නේය.



## දරුවන් මෙන්ම වැඩිහිටියන් ද රැකගැනීම අපේ යුතුකමක්!

**රසිකා සංජීවනී සහෝදරිය**
**නාගරික මන්ත්‍රිනී - කඩුවෙල නගර සභාව**

ඔක්තෝබර් පළවෙනිදා ලෝක ළමා හා වැඩිහිටි දිනය ලෙස සලකල අපි සැමරුම් උත්සව පවත්වනවා, තවත් නොයෙකුත් ක්‍රියා කාරකම් ඒ වෙනුවෙන් සිදු කරනව. හැබැයි මේ කොට්ඨාස දෙකම හැමදාම රැක බලා ගැනීම සමාජයේ කාර්යය භාරයක්. ඒක එකිනෙකාගේ  පෞද්ගලික කාරණයක් නොවිය යුතුයි. අන්න ඒ වෙනුවෙන් අපේ ආණ්ඩුව ක්‍රියා මාර්ග රැසක් අරගෙන තියෙනව.
  දරුවන් සඳහා මුල් ළමා විය සංවර්ධනය වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තියක්, නව ව්‍යුහාත්මක අධ්‍යාපන ප්‍රතිසංස්කරණ,දරුවන්  සමාජ මාධ්‍ය හා අන්තර්ජාලය ඔස්සේ අවදානමට හා අපයෝජනයට ලක්වීම වැළැක්වීම උදෙසා  ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය හා ඩිජිටල් සුරක්ෂිතභාවය වෙනුවෙන් ක්‍රමෝපායන් සකස් කිරීම ඉන් කිහිපයක් පමණයි.
ඒ වගේම වැඩිහිටියන් සඳහා දීමනා "අස්වැසුම " මගින් විධිමත් කිරීම හා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම, වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය  තුළින් රැකවරණය, සෞඛ්‍ය පහසුකම් හා දරිද්‍රතාවය පිටුදැකීම සඳහා කටයුතු කිරීම මෙන්ම විශ්‍රාම වැටුප් හා රාජ්‍ය අංශයේ වැටුප් සංශෝධන තුළින් වැඩි ප්‍රතිලාභ ලබාදීම මූලිකත්වයේලා  පෙන්වලා දෙන්න පුළුවන්.
ඒ නිසා පොහොසත් රටක ලස්සන ජීවිතයක් වෙනුවෙන් දරුවන් මෙන්ම වැඩිහිටියන්ද රැක ගැනීම අප සැමගේ යුතුකමක් මෙන් වගකීමක්.

# පාඨක සාහිත්‍ය උළෙලක්!

## පොත් වෙනුවට පාඨකයන් එළිදක්වන සාහිත්‍ය මාසයක් වෙනුවෙන්

ශ්‍රී ලංකාවේ සාහිත්‍ය මාසය ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ ඓතිහාසික තොරතුරුවලට අනුව 1956 වසරේදී ඒ සඳහා මූලික පදනම සකසා ඇති බව පෙනී යයි. මෙම කාර්යය සඳහා පුරෝගාමී කාර්යයක් ඉටු කළ දෙදෙනෙක් පිළිබඳව තොරතුරු දැක්වේ. 1956 වර්ෂයේ දී පිහිටුවන ලද එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක රජයේ සංස්කෘතික හා අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස කටයුතු කළ ජයවීර කුරුප්පු විසින් සාහිත්‍ය දිනය (Literary Day) ප්‍රථම වරට හඳුන්වා දෙන ලදී. එමෙන්ම ජ්‍යෝෂ්ඨ පුවත්පත් කලාවේදියෙකු වන පෙරමුණේ තිලක, 1958 ජනවාරි මාසයේදී සාහිත්‍ය උපදේශක සභාවට යෝජනාවක් ඉදිරිපත් කරමින් සාහිත්‍ය දිනයක් ප්‍රකාශයට පත්කිරීමට මුල් විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1958 ජූනි 01 වන දින රට පුරා ප්‍රථම සාහිත්‍ය දින උත්සවය පවත්වන ලදී. කාලයත් සමඟ මෙම සැමරුම වර්තමානයේ පවතින පරිදි සැප්තැම්බර් මාසය සාහිත්‍ය මාසය ලෙස නම් කිරීමට කටයුතු කර ඇත.

ශ්‍රී ලංකාවේ සාහිත්‍ය මාසය (සැප්තැම්බර්) සහ කියවීමේ මාසය (ඔක්තෝබර්) සංකල්පය ශ්‍රී ලංකාවට පමණක් ආවේණික වූවක් නොවේ. ලෝකයේ බොහෝ රටවල් සාහිත්‍යය, කියවීම සහ පොත් සම්බන්ධයෙන් විවිධ මාස, සති සහ දින වෙන් කර උත්සව සමරයි. ශ්‍රී ලංකාවේ මෙම සම්ප්‍රදාය ගෝලීය වශයෙන් පවතින පුළුල් ප්‍රවණතාවක කොටසකි.

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යා හා සංස්කෘතික සංවිධානය (UNESCO) විසින් සෑම වසරකම අප්‍රේල් 23 දිනය, ජාත්‍යන්තර පොත් සහ ප්‍රකාශන හිමිකම් දිනය (World Book and Copyright Day) ලෙස ප්‍රකාශයට පත් කර ඇත. එමෙන්ම යුනෙස්කෝ සංවිධානය විසින්ම මාර්තු 21 දිනය, ලෝක කවි දිනය (World Poetry Day) වශයෙන් ප්‍රකාශයට පත්කර ඇත. මේවා ලෝක මට්ටමින් සාහිත්‍යය වෙනුවෙන් වෙන් කරන ලද දිනයන් වේ.

එමෙන්ම, විවිධ රටවල් විසින්ද සාහිත්‍යය හා කවිය පදනම් කර ගනිමින් එය ප්‍රවර්ධනය හා ප්‍රචාරය කිරීම සඳහා දිනයන් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව එක්සත් ජනපදය සහ කැනඩාව විසින් අප්‍රේල් මාසය ජාතික කවි මාසය (National Poetry Month) ලෙස සමරනු ලැබේ. මෙය 1996 සිට එක්සත් ජනපදයේ සහ 1998 සිට කැනඩාවේ පවත්වනු ලබයි. එක්සත් රාජධානිය සහ අයර්ලන්තය, ඔක්තෝබර් මාසය ජාතික කවි මාසය ලෙස නම්කර සමරයි. එමෙන්ම, ඔක්තෝබර් මාසයේ පළමු බ්‍රහස්පතින්දා දිනය ජාතික කවි දිනය ලෙස පවත්වනු ලැබේ. ඉන්දියාව විසින්ද, ජාතික කියවීමේ මාසය (National Reading Month) ලෙස ජූනි 19 සිට ජූලි 18 දක්වා කාලය සමරනු ලැබේ. එක්සත් අරාබි එමීර් රාජ්‍යය, මාර්තු මාසය නිල වශයෙන් කියවීමේ මාසය ලෙස නම් කර ඇත. මෙය ජාතික කියවීමේ ප්‍රතිපත්තියක කොටසක් ලෙස පවත්වාගෙන යනු ලබයි. එමෙන්ම, පිලිපීනය විසින් අප්‍රේල් මාසය ජාතික සාහිත්‍ය මාසය (National Literary Month) ලෙස සමරනු ලැබේ.

මීට අමතරව ලෝකයේ විවිධ රටවල් සාහිත්‍යය හා කියවීම ප්‍රවර්ධනය කිරීමට උත්සව මෙන්ම කාලයන් යොදා ගනී. ලෝකයේ බොහෝ රටවල් සාහිත්‍ය උත්සව පවත්වයි. උදාහරණයක් ලෙස සිංගප්පූරු රචකයන්ගේ උත්සවය (Singapore Writers' Festival) (ඔක්තෝබර්/නොවැම්බර්), හොංකොං ජාත්‍යන්තර සාහිත්‍ය උත්සවය (Hong Kong International Literary Festival) (ඔක්තෝබර්/නොවැම්බර්) සහ සිඩ්නි රචකයන්ගේ උත්සවය (Sydney Writers' Festival) (මැයි) පෙන්වා දිය හැකිය. ඇතැම් රටවල් ඔක්තෝබර් මාසය, ජාතික පවුල් සාක්ෂරතා මාසය (National Family Literacy Month) ලෙසද සමරනු ලැබේ. මෙහි වැදගත්ම ප්‍රවණතාවක් ලෙස ලෝකයේ බොහෝ රටවල් විසින් සැප්තැම්බර් මාසයේ අවසන් සතියේදී සමරන තහනම් පොත් සතිය (Banned Books Week) පෙන්වා දිය හැකිය. කියවීම ප්‍රවර්ධනය කිරීම තුළින් දැනුම හා ප්‍රඥාව වෙනුවෙන් දොරටු විවෘත්ත කරන රටවල් මෙන්ම තහනම් පොත් සැමරීම ඔස්සේ භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස සම්බන්ධයෙන් අවධාරණය කිරීම, සාහිත්‍යය හා කියවීම කොතරම් වැදගත්ද යන්න නැවත නැවතත් පසක් කරයි.

සාහිත්‍ය දිනයක්, සාහිත්‍ය උළෙලක් හෝ සාහිත්‍ය මාසයක් ප්‍රකාශයට පත්කිරීම හුදෙක් කිසියම් උත්සවයක් හෝ අවස්ථාවක් සංවිධානය කිරීම යන සරල කාර්යයන්ගෙන් ඔබ්බට ගමන් කිරීම අවශ්‍යය. පාඨකයන් විසින් පොත් කියවීම නම් සන්දර්භයෙන් මිදී සමාජයක් විසින් තමන්ව නැවතත් කියවා ගැනීමේ අවස්ථාවක් බවට එය පත් කරගත යුතුය.

ලෝකයේ ගත්තද, ලංකාවේ ගත්ත ද සාහිත්‍ය මාස හා දින මඟින් පාඨකයා අක්‍රීය හෝ යාන්ත්‍රික/අක්‍රීය ප්‍රපංචයක් (Object) ලෙස හඳුනා ගනිමින් ලේඛකයා හෝ ප්‍රකාශකයා සක්‍රීය (Subject) ප්‍රපංචයක් ලෙස ස්ථානගතව ඇති බව පෙනී යයි. විචාරකයින් වුවද සිය වියමන් තුළින්



නිර්මාණකරුවා ඉලක්ක කර ගන්නා අතර, එම විචාරයන් යථාර්ථයක් බවට පත්වීමට නම් පාඨකයා කොතරම් වැදගත්ද යන්න අවධානයට ගෙන නොමැකි බව පෙනී යයි. සාහිත්‍යයෙන් සිදුවන වැදගත්ම කාර්යයක් වන්නේ නිර්මාණාත්මක පරිකල්පනය ඔස්සේ විකල්පයන් ගොඩනැගීමට දායක වීමයි. එය මානව සංවර්ධනයට අත්‍යවශ්‍ය සාධකයකි. එය මිනිසාගේ සංජානන, භාවාත්මක, සමාජ, සදාචාර, සංස්කෘතික හා ආර්ථික හැකියාවන් එකවර පුළුල් කිරීමට දායක වේ. එහෙත්, මෙම කාර්යයන් ඉටු කළ හැක්කේ ලේඛකයාටද යන්න අප විසින් දැඩිව අවධානයට ගත යුතු තර්කයකි.

සාහිත්‍ය මාසය නිර්මාණකරුවන් හා ප්‍රකාශකයන්ගේ උනන්දුව දනවන මාසයක් බවට පත්ව ඇතත් එය අත්‍යන්තයෙන්ම " පාඨකයා සක්‍රීය වන මාසයක්" බවට පත් කර ගැනීමේ අවශ්‍යතාව අප සමාජය හමුවේ පවතී. මේ සම්බන්ධයෙන් අදහසක් රොලාන් බාර්ත් (Roland Barthes, 1915-1980) ගේ අදහසක් ඇසුරින් පැහැදිලි කළ හැකිය. බාර්ත් යනු ලිවීමට වඩා කියවීම (Reading) පිළිබඳව ඉතා ගැඹුරු හා බලපෑම් සහගත අදහස් ඉදිරිපත් කරන ලද විචාරකයෙකි. ඔහුගේ සාහිත්‍ය විචාරයේ කේන්ද්‍රීය තේමාවක් වූයේ කතුවරයාගේ අභිප්‍රායට වඩා පාඨකයාගේ කියවීමේ ක්‍රියාවලියට හා අර්ථ නිර්මාණයට ප්‍රමුඛත්වය දීමයි.

ඔහුගේ The Death of the Author (1967) හෙවත් කතුවරයාගේ මරණය නම් ලිපියේදී තර්ක කරන්නේ ග්‍රන්ථයක අර්ථය කතුවරයාගේ ජීවිත කථාව, අභිප්‍රායන් හෝ මනෝවිද්‍යාව මත රඳා නොපවතින බවයි. ඔහු අවධාරණය කරන ලද්දේ පාඨකයාගේ උපත සිදුවීමට නම් කතුවරයාගේ මරණය සිදුවිය යුතු බවයි. බාර්ත් එයින් අදහස් කරන ලද්දේ අර්ථය ලේඛකයාගෙන් නිකුත් වන අවසාන නිෂ්පාදනයක් නොව, පාඨකයා තුළ ජීවමාන වන ක්‍රියාවලියක් බවයි. ඒ වෙනුවෙන් සක්‍රීය පාඨකයෙකු අවශ්‍ය බවයි.

බාර්ත් තවදුරටත් සඳහන් කරන්නේ පාඨයක් යනු සංස්කෘතික කේන්ද්‍ර ගණනාවකින් ලබාගත් උද්ධෘතවලින් වියන ලද රෙද්දක් බවයි. මෙහිදී පාඨකයා එම උද්ධෘත සියල්ල එකට රැස් කරන අවකාශය ලෙස ක්‍රියා කරයි. එබැවින්, කියවීම යනු ඔහුට අනුව නිශ්චිත අර්ථයක් සොයා ගැනීම නොව, සංඥා අතර ඇති සම්බන්ධතා ගවේෂණය කිරීමේ සංකීර්ණ ක්‍රියාවලියකි. ඒ අනුව කියවීම යනු එක් අර්ථයක් ලබා ගැනීම සඳහා වන යාන්ත්‍රික ක්‍රියාවක් නොවේ. එය පාඨකයා සක්‍රීයව සහභාගී වන නිර්මාණශීලී ක්‍රියාවලියකි. ඔහුගේ The Pleasure of the Text (1973) කෘතියේදී ඔහු "කියවීමේ කාමුකත්වය" (erotics of reading) පිළිබඳ කථා කරයි, එහිදී කියවීම ශරීරයට හා ඉන්ද්‍රියන්ට සම්බන්ධ අත්දැකීමක් ලෙස දකියි. ඔහු ග්‍රන්ථයක් සමඟ පාඨකයාගේ සම්බන්ධය "ආදරය, කාමුකත්වය හා සතුට" යන වචනවලින් විස්තර කරයි.

මෙමගින් පැහැදිලි වන්නේ සාහිත්‍යයේදී වඩාත් සක්‍රීය විය යුත්තේ ලේඛකයා හෝ නිර්මාණකරුවා නොව පාඨකයා බවයි. පාඨකයාට කියවීම මඟින් ඉටු කළ යුතු සමාජයමය ක්‍රියාවක් ඇත. කියවීම තුළින් පාඨකයා විසින් ඉටු කරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් තවදුරටත් අදහස් දක්වන බාර්ත් පවසන්නේ අර්ථය නිර්මාණය කිරීමේ සක්‍රීය සහභාගිවීම පාඨකයා විසින් සිදු කරන බවයි. පාඨයක්, පාඨකයාගේ ග්‍රහණයට ලක්වීමෙන් අනතුරුව කතුවරයාට තවදුරටත් එහි අර්ථය පාලනය කළ නොහැකි බවයි. එය විවිධ පාඨකයන් විසින් විවිධ ආකාරවලින් අර්ථකථනය කරන විට, අර්ථය නිපදවන්නෙකු ලෙස කතුවරයා තවදුරටත් අදාළ නොවේ. එබැවින්, නිර්මාණයක අර්ථය රඳා පවතින්නේ කතුවරයා මත නොව පාඨකයා මත බවට ඔහු තර්ක කරයි. ඒ අනුව, කිසියම් ලේඛනයක් සම්බන්ධයෙන් රචකයාට හෝ ලේඛකයාට පැවරෙන වගකීමට වඩා ඉහළ වගකීමක් පාඨකයාට පැවරේ. ලේඛකකත්ව වගකීම් භූමිකාවෙන් ඔබ්බට ගොස් වගකීම්

11 වැනි පිටුවට

> **සාහිත්‍ය දිනයක්, සාහිත්‍ය උළෙලක් හෝ සාහිත්‍ය මාසයක් ප්‍රකාශයට පත්කිරීම හුදෙක් කිසියම් උත්සවයක් හෝ අවස්ථාවක් සංවිධානය කිරීම යන සරල කාර්යයන්ගෙන් ඔබ්බට ගමන් කිරීම අවශ්‍යය. පාඨකයන් විසින් පොත් කියවීම නම් සන්දර්භයෙන් මිදී සමාජයක් විසින් තමන්ව නැවතත් කියවා ගැනීමේ අවස්ථාවක් බවට එය පත් කරගත යුතුය.**



"පැරණි ධනපති සමාජයෙන් අපට ඉතිරි කර තිබෙන ලොකුම උවදුර සහ අභාග ්‍යයන් අතුරෙන් එකකි, පොත් සහ ප්‍රායෝගික ජීවිතය අතර සම්පූර්ණ පරස්පරය. සියලු දේම හැකි අනර්ඝතම ආකාරයෙන් විස්තර කරන පොත් අපට තිබිණි. එහෙත් අති බහුතර ගණනක්ම අවස්ථාවලදී මෙම පොත්වල අන්තර්ගත වූයේ ඉතාමත් විනාශකාරී සහ වංචා සහගත බොරුය. ධනපති සමාජය ගැන බොරු විස්තරයක්ය."

**ලෙනින්**
**රජය හා විප්ලවය**

# පොලිටිකල් පංතිය

පොලිටික්ක පංතියට එන්න පරක්කු අතරෙ ළමයි හොරා පොලිස් සෙල්ලමක් පටන් ගත්ත... මේ පොඩි පංති කාමරයක් ඇතුළෙ මොන හොරා පොලිස්ද? හැංගෙන්නෙ කොහොද කියල හිතුවට මෙතන වැඩේ ගියේ වෙන විදිහකට; හරියට කලින් ආණ්ඩු තියෙද්දි වගේ. ඒ කියන්නෙ හොරු අල්ලන කෙනා වෙච්ච පොලීසියෙ කෙනාගෙ ඇස් බැඳලා ලේන්සුවකින්. අතපත ගගා හොරු හොයනවා. අනෙක් පැත්තට හොරුන්ට කරදරයක් නෑ... ඇස් පේනවා... හැමතැනම ඇවිදිනවා... සිත් සේ... හොරු අහුවෙන්න යනවා වගේ පේනකොට බලන් ඉන්න අය වියර් දානවා... හොරු අහකට පනිනවා.

"ගුඩ් මෝනිං ළමයිනේ " පොලිටික්ක පංතියට එනකොටම කියාගෙන ආවෙ මේ මොකවත් දන්නෙ නැතුව.

"ගුඩ් මෝනිං සර්... ගුඩ් කිවුවට මේ වෙලාවෙනම් ගුඩ් වෙලා තියෙන්නෙ හොරුන්ටම තමයි" කනිය ෆුල් සීන් එකේ ඉන්න ගමන් කිවුවෙ ඇස් අයින් නොකරම.

"මොකද්ද ළමයිනේ මෙතන වෙන්නෙ" පොලිටික්ක ඇස් බැඳන් හිටපු මංජුව දැක්කෙ පස්සෙ.

"මෙතන සර් ලොකු ගේමක් යනව... අඩුම ගාණෙ එහෙම වෙන බව පෙන්න තියෙනවා" කනිය තොරණෙ විස්තරේ කියන්න බැලුව. "හොරු අල්ලනව කියල තමයි කියන්නෙ... හැබැයි අල්ලපු හොරෙක් නෑ"

"ඕක පරණ නාට්ටියක්නෙ. රනිල්ලගෙ ආණ්ඩුව කාලෙ තිබුණෙම ඕකනෙ. වැඩේ යටින් නෙමෙයි ගියේ උඩින්..." බස්ස අතින් පෙන්නලම කිවුව.

"නීතියේ දෙවඟන ඇස් බැඳගෙන හිටියට අල්ලන එකා ඇස් බැඳගෙන හිටියොත් ඇල්ලිලි බොරු" මංජුව ඇස් වහගෙන හිටපු ලේන්සුව ගලෝල දැම්ම.

"හැබැයි ඒ කාලෙ පරීක්ෂණ පටන් ගත්ත නේද? ගොඩක් නඩුත් දැම්මෙ නේද?" පොලිටික්ක අතීත සිහිනෙකට ගොඩවෙලා.

"දැම්ම තමයි... හැබැයි පොඩි නාට්‍යයක් නේද ගියේ? ශිරන්තිලා සිංගප්පූරු පැන්නෙ නැහැ. එයාලගෙන් කටඋත්තර ගත්තෙ එයාලා කැමති තැනකට ගිහින්... කටුනායක නිල නිවසටනෙ ගියේ. ගොඩක් කතාවලට කටුනායක නිල නිවස සම්බන්ධ වෙලා තිබුණා... අමතර කතාවක් වුණත් එයාර්බස් වංචාව කියල පස්සෙ ප්‍රසිද්ධ වෙච්ච එයාර්බස් 06ක් ගන්න තීරණේ ගත්තු එයාර්ලංකා අධ්‍යක්ෂ මණ්ඩලේ රැස්වෙලා තිබුණෙත් එතනනෙ. ප්‍රංශෙ එයාර්බස් සමාගම තමන් අල්ලස් දුන්නා කියලා නඩුවෙදි එළිදරව් කළාම තමයි අහුවුණේ සල්ලි වටේ ගිහින් පවුලට ආපු විදිහ. දැනට කියන්නෙ මිලියන 600ක් වමට ගිහින් කියලනෙ. දැන් ලොකු පුතා නාමල් මහත්තයාට නිතර නිතර නිල් බස් එකෙන් උසාවි එන්න වෙන එක හේතුවක් ඒක. මාංචු පේන්න අත් උස්සලා බස් එකෙන් බැස්සට මේක සාධාරණයි කියල කියන්න බැරි ලැජ්ජා නැති වැඩක්... ක්‍රිෂ් බිල්ඩිං එක ගහපු ඉඩම ඒ සමාගමට අරන් දෙන්නත් මිලියන 70ක් සල්ලි අරන් කියනවනෙ... " සමන ස්ටාට් එක ගත්තෙ ඩෙස් මුල්ලකට බරවෙන ගමන්.

"අන්න එයාට දෙවෙනි නෑ සිරිලිය අම්මත්. පෙට් ස්කෑනිං යන්ත්‍රයක් ගන්න ඉතිරි කිරීමේ බැංකුවෙන් මිලියන 10ක් අරන්නෙ. ඒකට සල්ලි එකතු කළාට ස්කෑනිං මැෂින් එක චීනෙන් නොමිලේ හම්බුවෙලා... එකතු කරපු සල්ලිවලට වෙච්ච දෙයක් නැහැ... දැන් උත්තර දෙන්න බැරුව වටේ යනව. ඉස්පිරිතාලෙ යනවා. එතනින් එයාර්පොට් යනවා. එතනින් සිංගප්පූරු යනවා. එහෙ ගිහින් මෙඩිකල් චෙකප් කරනවා ෂොපිං කරන ගමන්..." වසන්තියත් ගෙදරින් ගත්ත අප්ඩේට් එකක් දැම්මෙ ෂොපිං යන විදිහ පෙන්නන ගමන්.

"දැන් බාප්ප වෙච්ච ගෝඨාභය තමන්ව අත්අඩංගුවට ගන්න එක වළක්වන්න කියලා රිට් එකක් ගන්න උසාවි ගියා. ඒක විසි වුණා. ඒ කාලෙ දිගටම තහනම් නියෝග අරගෙන නඩුවලින් කට්ටි පැන්නනෙ... ඒ වගේ දැනුත් පනින්න පුළුවන්ද කියල බලන්න ඇත්තෙ... ඔය මොනව කළත් හැබැයි පාස්කු කුමන්ත්‍රණේට අදාළ නඩුවක් 'කම්ං ඔන්ද වේ'..." මංජුව කිවුවෙ බෙල්ල වටේට ලේන්සුවෙන් ගැටයක් දානව පෙන්නන අතරෙ.

"පවුලෙ නඩු තව ඉවර නැහැ... බැසිල් බාප්පට මාතර බ්‍රවුන්ස්හිල්වල ඉඩමක් අරගන්න මිලියන 50ක් හම්බ වුණේ කොහොමද කියල හොයනවා... මුදල් විශුද්ධිකරණ පනත යටතෙ... නඩුවට ආවෙ නැති නිසා නිල් වරෙන්තු. යෝෂිත මල්ලිට හොර පාරෙන් නාවික හමුදාවට ඇතුල් වුණාට නඩු. දෙහිවල, රත්මලාන මිලියන 70 ගාණක ඉඩම් ගත්ත එකට යෝෂිතටයි... ඩේසි ආච්චිටයි දෙන්නට නඩු. ශෂීන්ද්‍ර අයියටයි චමල් මහප්පටයි එහෙන් නඩු... රජයේ ඉඩමක හොරට හදපු ගේ ගිනි ගත්ත එකට හොරට වන්දි ගත්ත කියල. පවුලට ගෑවුණු කෙනෙක් ඇත්නම් එක්කො පරීක්ෂණ... එක්කො නඩු... " සමන පොලිටික්ක දිහා බැලුවා. " දැන් නාට්‍ය නැහැනෙ සර්. වෙන්න ඕනෙ විදිහටම වැඩේ යනවා..."

## කවුළුව හැරමි තබමි

# රතු මාවතේ ඓතිහාසික මුද්‍රාව...



රුසියාවේ ඔක්තෝම්බර් විප්ලවය යනු තව චිරාත් කාලයක් ලෝක ඉතිහාසයේ ගැඹුරින්ම විප්ලවීය මුද්‍රාව තැබූ සිද්ධියක් ලෙස පවතිනු නිසැකය.

ඔක්තෝම්බර් විප්ලවයේ නිර්ධන පංති ආඥාදායකත්වයේ කළලය ලෙස සෝවියට් සභාව ලෙනින් විසින් හඳුන්වන්නට යෙදුණි. 1905 දී විප්ලවයේ කලලය ලෙස එය හඳුනා ගන්නටත් 1917දී එය පිරිපුන් නිර්ධන පන්ති රාජ්‍ය යාන්ත්‍රණය දක්වා පෝෂණය කර රැගෙන ඒමටත් ලෙනින් ප්‍රමුඛ බොල්ෂෙවිකයන්ට හැකි විය. ඔනෑම විප්ලවවාදී පක්ෂයකට එකවර පන්තියේ නියමුවා බවට පත්විය නොහැක.

සෝවියට් සභා කිසියම් දේශපාලන පක්ෂයක මූලිකත්වයෙන් හෝ පූර්වයෙන් සැලසුම් කරන ලද ක්‍රමයකට එකවර ආරම්භ වූවක් නොව කම්කරු පන්තියේ ක්‍රමිකව වැඩුණු විවිධ විප්ලවීය ක්‍රියාකාරකම් මත ස්වයංව උපත ලද්දකි. සෝවියට් ව්‍යාපාරය යනු මේ සියලු සටන් සංවිධානවල ඒකාබද්ධ ක්‍රියාකාරීත්වයයි. මෙවැනි ව්‍යාපාරයක් නොතිබුණා නම් බොහෝ විට එදා අරගලය නිදැල්ලේ යාමට නැතිනම් ධනේශ්වර විප්ලවවාදීන් ඇතුළු ප්‍රතිගාමීන් අතට පත්වීමට ඉඩ තිබූ බව ලෙනින් පසු අවස්ථාවක අවධාරණය කළේය.

මෙය එක්තරා අයුරකින් ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛව ජාතික ජන බලවේගය නායකත්වය දී පසුගිය ජනාධිපතිවරණයට හා මහා මැතිවරණයට පෙර ගොඩනැගූ කොට්ඨාස සභා ආකෘතිය අපට සිහිග න්වයි. කොට්ඨාස සභා නමැති කලල බීජයෙන් පටන් ගත් අපි ඉන්පසු කම්කරු, කාන්තා, ගොවි, ශිෂ්‍ය ආදී බලවේග සහ විවිධ දහරාවන් ගොඩනගා අවසානයේ ජයග්‍රහණය දක්වා ගමන් කළෙමු.

ලෙනින්ගේ අපේක්ෂාව වූයේ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස බලය ප්‍රාදේශිකව විමධ්‍යගත වූත් එලෙසම රටක් වශයෙන් මධ්‍යගත වූත් ඒකීය සමාජවාදී රාජ්‍යයකි.

ලෙනින් වරෙක සඳහන් කළේ "විප්ලවීය න්‍යායෙහි හරය" සම්බන්ධයෙන් ලෝක කොමියුනිස්ට් ව්‍යාපාරය සපයා ඇති ඓතිහාසික අත්දැකීම් උකහා ගැනීම සියලු සමාජවාදීන්ගේ අත්හළ නොහැකි කාර්යයක් බවයි. ඔක්තෝබර් විප්ලවය යනු යා යුතු තැන සහ යා යුතු විදිහ පිළිබඳ දැවැන්ත ලෝක අධ්‍යයනයකි. එහි වැරදී ගිය තැන් නිවැරදි කර, වර්තමාන භාවිතයට ගැනීමට නම් සියලු විප්ලවවාදීන් විසින් එය ආරම්භ කළ යුතුමය.

# ජෝගි දෙකයි - ආතල් කෝටියයි...

පසුගිය දින කිහිපය තුළ මේ රටේ හුදී ජනයාට අපූරු ජෝගි දෙකක් දැකීමේ භාග්‍යය උදාවිය. ඉන් එකක් වන්නේ සැප්තැම්බර් 12 වැනිදා අනුරාධපුරයේ පැවති පොහොට්ටු රැස්වීමය. අනෙක වන්නේ 22 සංශෝධනයට විරුද්ධව සැප්තැම්බර් 24 වැනිදා සජිත් ප්‍රමුඛ සමගි ජන බලවේගය පොල්දූවේදී පැවැත්වූ උද්ඝෝෂණයය. මේවායේ සිදුවූ හාස්‍යජනක සිදුවීම් හා විකාරරූපී ස්වභාවය මුළු රටම දුටුව හෙයින් ඒ ගැන පුනපුනා කිව යුතු නැත. මේ ජෝගි දෙකේම දුටු පොදු ලක්ෂණය වූයේ ඒවාට සහභාගි වූ මිනිසුන් තමන් සහභාගි වූයේ කුමටද, කුමක් සඳහාද යන්නවත් නොදැන සිටීමය. ඒ තරමට අසරණ වූ මිනිස් ශරීර තම පිළිකුල් සහගත දේශපාලන අරමුණු වෙනුවෙන් යොදා ගැනීමට තරම් පොහොට්ටු නායකයෝ සහ සමගි ජන බලවේගය නායකයෝ ඉතාම පහත් තත්වයකට ඇද වැටී සිටිති. ඉන් දෙන සංඥාව නම් ඔවුන්ගේ දේශපාලනය අද ලාංකේය භූමිය තුළ කෙතරම් කුජීතභාවයට ඇද වැටී ඇත්ද යන්නයි. ඒ. කුජීතභාවය කොතරම්ද යත් විපක්ෂයේ පක්ෂ ඒකාබද්ධව පැවැත්වීමට යොදා ගත් 24 දා විරෝධය අවසාන වූයේ අර ඒකාබද්ධය සුනේ සුන්වීය. එකිනෙකා හැල්ලු කර ගනිමින් එකිනෙකාට චෝදනා කරමින් මේ රැලි හා විරෝධතා අවසන් වූයේ විපක්ෂයේ දේශපාලනය මොනතරම් මස්තබාල්දු වී ඇද්ද යන්නත් අනුර සහෝදරයා ප්‍රමුඛ ජාතික ජන බලවේග ආණ්ඩුව මේ වන විට කොතරම් දේශපාලනිකව පරිණතභාවයක් අත්පත් කරගෙන ඇත්ද යන්නත් තහවුරු කරමිනි.



නාමල්ලා 12 වැනිදා අනුරාධපුරයේදී හොඳටම අනාගෙන දේශපාලන සුරතාන්තයට පත්වූ අතර සජිත්ලා 24 වැනිදා හොඳටම නාගෙන පොල්දූවේදී දේශපාලන සුරතාන්තයට පත්විය. නැවත කිසිදිනෙක ඔවුන්ගේ දේශපාලනය මේ පොළොව මත ප්‍රාණවත් නොවන බවට කදිම සහතිකයක් ඔවුන් රටට ලබාදී මාරය. දැන් ඔවුනට ඉතිරිව ඇත්තේ ජෝගි සහ කුණුහරුප පමණය. ඉදින් ඒ මත තව චිරාත් කාලයක් මේ රටේ විපක්ෂයට වැජඹීමට ලැබේවායි අපි ප්‍රාර්ථනා කරමු.

# එක මිටට එක පෙළට හොරු හිරේට...




දශක ගණනාවක් පුරා රාජපක්ෂලා තනාගෙන තිබූ 'මහා බවයේ' පොදු ඓක්‍යයෙහි ප්‍රතිඵල භුක්ති විඳීමේ භාග්‍යය දැන් ඔවුනට උදාවී තිබේ. ඔවුන් එම ප්‍රතිඵල භුක්ති විඳින විට ඉන් කැලඹුණු තුෂ්ණීම්භූත වූ තවත් පිරිස් ගණනාවක්ම සිටිති. ඒ, සුන්බුන් විපක්ෂයේ ගර්හිත මිනිස් ශරීර හා රාජපක්ෂවාදී වී, බඩ වියත රැකගත් මජර නඩයයි. පිය උරුමයෙන්ම අපරාධකරුවන්, හොරුන් වූ සජිත්ලා නාමල්ලාගේ සල්ලාල සඳලු තල මේ වන විට බිමට කඩා වැටෙමින් තිබේ. මින් වඩාත් අසරණභාවයට පත්ව ඇත්තේ ඔවුන්ගේ පරිවාර සේනාය. රාජපක්ෂලාගේ දෙවන පෙළ හොරු සිරගත වන විට කෙඳිරි ගෑ, මේ පරිවාර හොරු දැන් ඔවුන්ගේ නායක හොරු හිරේ වැටෙන විට දැත් හිසමත තබා අඳෝනා නගන්නට පටන් ගෙන සිටිති. රාජපක්ෂලාගේ ජාතිවාදී ආගම්වාදී ලණු ගිල්ල බොහෝ පිරිස් දැන් මහලු වියට පත්ව ඇත. ඒ නිසා යන එන මං නැතිව රාජපක්ෂ දේශපාලන වනාන්තරයේ අතරමං වී සිටින ඔවුහු දැන් අසිහියෙන් මෙන් හිස හැරුණු හැරුණු අත ගමන් කිරීමට පටන් ගෙන සිටිති. රට කෑ, රට වැනසූ පාපිෂ්ඨයෝ අඳුරු කුටි තුළ පෝලිමේ සිරගත වෙමින් සිටිති. කලෙක රජවරුන් මහාමාත්‍ය හා කුමාරවරුන් ලෙස මෙරට අහිංසක ජනතාවගේ රීරි මාංශ උරා බී, සැණකෙළි පැවැත්වූ ඔවුහු දැන් අඳුරු හුදෙකලා හිරකුටි තුළ සිය අවසන් කාලය ගෙවා දැමීමේ ඛේදනීය ඉරණමට ගොදුරු වී සිටිති. හොරකම් කොට හැදූ මාලිගාවල සිට සිරකුටිවලට ඇත්තේ එක් පියවරක් බව මාලිමා ආණ්ඩුව ඔවුනට පසක් කර දී තිබේ. මේ ආණ්ඩුව නොඑන්නට ඔවුන් තවමත් මාළිගාවලය; ජනතාව නරකාදියේය. දැන් ජනතාව නරාවලෙන් ගොඩ ඒමට පටන්ගෙනය. ඔවුන් එතනට තල්ලු කළ අපරාධ රාජ්‍යයේ රජවරුන්ට දිට්ඨ ධම්ම දේශපාලන කර්මය පළ දී තිබේ. දැන් ඔවුනට ඇත්තේ හිත හදාගෙන විඳවීමටය.

## පාඨක සාහිත්‍ය ...

9 පිටුවෙන්..

සහගත පාඨකයෙක් වීමේ වැදගත්කම මින් අවධාරණය කෙරේ. කිසියම් කෘතියක අර්ථය යනු රචකයා ලියූ දේ නොව පාඨකයා විසින් ග්‍රහණය කරගත් දේය. ඔහු විසින් සමාජය හමුවේ ප්‍රතිනිර්මාණය කරන දේය. වර්තමානයේ සමාජ මාධ්‍ය බහුල සමාජයක මෙම කරුණ වඩ වඩාත් ප්‍රබලව ඉස්මතු වන බව අපට ප්‍රත්‍යක්ෂ සත්‍යයකි.

බාර්ත් පාඨකයා හඳුන්වන්නේ "ලිඛිත පාඨය සෑදෙන සියලු සලකුණු තනි ක්ෂේත්‍රයක එකට රඳවා තබන තැනැත්තා" ලෙසයි. ලේඛකයා විවිධ අත්දැකීම් සහිත, විවිධ සංස්කෘතික පසුබිම්වලින් පැමිණෙන අයෙකු විය හැකිය. ඒ සියල්ල කිසියම් නිශ්චිත පාඨකයෙකු විසින් පරිශීලනය කරන විට, ලේඛකයාට වඩා පැතිරුණු පරාසයක පාඨකයා සක්‍රිය වන බවත්, එනිසාම, පාඨකයා ලේඛකයාට වඩා, බුද්ධිමත් සහ ප්‍රඥාසම්පන්නවීමක් අපේක්ෂා කරන බවත් මෙහි අර්ථයයි.

මේ සම්බන්ධයෙන් වාග් විද්‍යාත්මක එළඹුමක් ඔස්සේ කරුණු පැහැදිලි කරන බාර්ත්, "පාඨක" සහ "රචක" පාඨ අතර වෙනස සිය S/Z (1970) සහ The Pleasure of the Text (1973) යන කෘතිවලින් පැහැදිලි කර ඇත. එම කෘතිවලින් ඔහු පාඨ වර්ග දෙකක් හඳුන්වා දෙයි. පළමු පාඨ වන්නේ පාඨක පාඨ (Readerly Text / Lisible) යන්නයි. මෙය සම්ප්‍රදායික, සංවෘත පාඨයකි. එය පාඨකයාට නිශ්චිත අර්ථයක් ලබා දෙන අතර, පාඨකයා බොහෝ දුරට යාන්ත්‍රික පාර්ශ්වයක් ලෙස රැඳී සිටී. මෙය ප්‍රඥාවට හෝ බුද්ධියට වඩා 'සතුට' (Plaisir) ලබා දෙන බව බාර්ත් පවසයි.

ඔහු විසින් හඳුන්වා දෙනු ලබන දෙවන පාඨ විශේෂය වන්නේ රචක පාඨ (Writerly Text/ scriptible) යන්නයි. මෙය විවෘත, අර්ථයන් බහුල පාඨයකි. මෙහිදී පාඨකයාට සක්‍රියව අර්ථය නිර්මාණය කිරීමට සිදු වේ. ඔහු ලේඛකයාගේ ක්‍රියාවලිය නැවත නිර්මාණය කරමින් පාඨයේ සම-නිර්මාණකරුවෙකු බවට පත් වේ. මෙය 'ආනන්දය' (බුද්ධිය හා ප්‍රඥාව) (jouissance) ලබා දෙයි.

බාර්ත්ගේ මතයට අනුව, පාඨකයාගේ කාර්යභාරය හුදෙක් අර්ථය ලබා ගැනීම නොවේ. ඔහුගේ From Work to Text රචනයේදී ඔහු පවසන්නේ සාහිත්‍ය කෘතියක අරමුණ විය යුත්තේ පාඨකයාව තවදුරටත් යාන්ත්‍රික පරිශීලකයෙකු හෝ පාඨ පරිභෝගිකයෙකු නොව, පාඨයේ ප්‍රති-නිෂ්පාදකයෙකු බවට පත් කිරීම බවයි. එනම්, පාඨකයා අර්ථය සොයා ගැනීමේ අක්‍රීය ක්‍රියාවක නිරත නොවී, එය නිරන්තරයෙන් නැවත නිර්මාණය වන ක්‍රියාවලියක් ලෙස අත්දකින්නෙකු විය යුතුය. කෙටියෙන් කියතොත්, බාර්ත් සඳහා පාඨකයා යනු අර්ථයේ අවසාන ගමනාන්තය පමණක් නොව, එය නිර්මාණය වන ස්ථානයද වේ.

සාහිත්‍යයේදී සෙසු කලා කෘති පරිශීලනය කරන පාඨක/රසික ප්‍රජාවට වඩා ඉහළ වගකීමක් පාඨකයාට පැවරෙන බව මෙහි නිගමනයයි. සාහිත්‍යය හෝ කලාව සමාජය මත විශාල බලපෑමක් කළ හැකි ප්‍රපංචයක් බවට අප විසින් තර්ක කරනු ලැබුවේ වුවද, එවැන්නක් සිදු කළ හැකි පාඨකයෙක් නිර්මාණය කිරීමට අපොහොසත් සමාජයක මොන යම් හෝ උසස් සාහිත්‍ය නිර්මාණයකට කළ හැකි මෙහෙවරක් නැත.

උසස් කෘතියක් යනු පාඨකයාට උපත දෙමින් කතුවරයා මිය යාමේ ක්‍රියාවලියක් බවට බාර්ත් තර්ක කරනුයේ මෙකී සමාජමය බලපෑම සජීවීකරණය කළ හැක්කේ පාඨකයාට පමණක් බව බැවිනි. ඔහු සිය අවසන් නිගමනයට එළඹෙන්නේ " පාඨකයාගේ උපත සිදු විය යුත්තේ කතුවරයාගේ මරණයේ මිලටයි" යන ප්‍රකාශයෙනි. එහි අර්ථය කවර හෝ ගැඹුරු සාහිත්‍යයක් වුවද එහි නියම වටිනාකම ලබා දෙනු ලබන්නේ පාඨකයා විසින් බවයි. පාඨයක් බොහෝ සංස්කෘතීන්ගෙන් ලබාගත් බහුවිධ ලේඛනයන්ගෙන් සෑදී ඇත. එම බහුත්වය එකට එකතු වන එකම ස්ථානය පාඨකයා වේ. පාඨයක වටිනාකම රඳා පවතින්නේ එහි මූලාරම්භයේ හෙවත් ලේඛකයාගේ නොව, එහි ගමනාන්තය හෙවත් පාඨකයාගේය. කිසිවෙක් සාහිත්‍ය කෘතියක් පෞද්ගලිකව කියවන හෝ රස විඳින බවක් පෙනී යන්නේ වුව ද මෙම ගමනාන්තය තවදුරටත් පුද්ගලික නොවන බව බාර්ති පවසයි. ලේඛකයාට මෙන් නොව පාඨකයාට ඉතිහාසයක්, සමාජ පෞරුෂයක්, චරිතාපදානයක් හෝ මනෝවිද්‍යාවක් නොමැත. ඔහු හුදෙක් ලිඛිත පාඨය සෑදෙන සියලු සලකුණු තනි ක්ෂේත්‍රයක එකට රඳවා තබන තැනැත්තායි. එහෙත්, කිසියම් රචනයක් සමාජ වටිනාකම් ප්‍රතිනිර්මාණය කරන මහා බලවතා වන්නේ පාඨකයායි.

උසස් සාහිත්‍ය කෘති බිහිකිරීමෙන් උසස් රටක්, සංස්කෘතියක් හෝ සමාජයක් නිර්මාණය කළ නොහැකි නමුත් උසස් රසඥතාවකින් යුත් විදග්ධ, බුද්ධිමත් හා ප්‍රඥාවන්ත පාඨකයින් පිරිසක් නිර්මාණය කිරීමෙන් උසස් සංස්කෘතියක් සහිත ශිෂ්ට සමාජයක් බිහි කළ හැකිය. සාහිත්‍ය මාසයේදීත්, පොත් කියවීමේ මාසයේදීත් අපගේ අවධානය වර්තමානයේ යොමුව පවතින ඉලක්කයට හෝ අරමුණට වෙනස්ව පාඨකයින් බිහි කරන අරමුණ කෙරෙහි වැඩි බර තැබීමක් කළ යුතු බවට යෝජනා කරන්නේ එහෙයිනි. සාහිත්‍ය මාසය පාඨක සාහිත්‍ය උළෙලක් සංවිධානය කරන මාසයක් මෙන්ම කියවීමේ මාසය පොත් වෙනුවට පාඨකයන් එළිදක්වන මාසයක් ලෙස ප්‍රති-නිර්මාණය කළ යුතු බවට අප විසින් යෝජනා කරන්නේ එබැවිනි.

## අපි ජනතා බලය..

1 පිටුවෙන්..

නොගහපු ආණ්ඩුවක්. මේ අයුරින් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර තිබෙනවා. අපි විශේෂ පනතක් ගෙනවිත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප අහෝසි කළා. අමාත්‍ය නිවාසවල වතුර බිල්, විදුලි බිල් රජයෙන් ගෙවීම අහෝසි කළා. ඇමතිවරුන්ට දුන් ඉන්ධන දීමනාව අඩු කළා. හිටපු ජනාධිපතිවරුන්ට ගෙවල්, කාර්යාල වාහන අද කිසිවක් දෙන්නේ නැහැ. දේශපාලකයා මහජනතාවට බරක් නොවිය යුතුයි. ව්‍යාපාරයක් බවට පත්ව තිබූ දේශපාලනය පසුගිය වසර දෙක තුළ මහජන සේවාවක් බවට පරිවර්තනය කිරීමට අපි සමත් වී තිබෙනවා.

ඒ වගේම ජනතාව විශ්වාස කළා අපි දූෂිතයින් අල්ලයි කියලා. මේ වසර දෙක තුළ අපි ඔප්පු කරලා තිබෙනවා අපි ඒ වැඩේ කරන බව. අපි කෙරෙහි සියයට සීයක් විශ්වාස තැබූ තව කරුණක් වන්නේ රට තුළ කිසිදු ආකාරයක ජාතිවාදී ගැටුමක් ඇතිවීමට ඉඩ නොදෙයි යන විශ්වාසය. මේ අවුරුදු දෙක තමයි ලංකාවේ ජාතිවාදී ගැටුමක් පිළිබඳ කිසිදු පොලීසියකට පැමිණිල්ලක් නොලැබුණු වසර දෙක. අපි පසුගිය වසර දෙක තුළ ජාතිවාදයට ඉඩ නොතබා මේ රට පාලනය කර තිබෙනවා. ඒ වගේම ජනතාව අපේක්ෂා කළා නීතියේ විධානයේ ආධිපත්‍ය සියලුදෙනාට සමාන විය යුතුයි කියලා. ලොකු පොඩි බේදයකින් තොරව නීතිය ඉටු වීම මේ රටේ ජනතාවගේ අපේක්ෂාවක්. පසුගිය වසර දෙක තුළ තරාතිරම නොබලා නීතිය ක්‍රියාත්මක වන රටක් අපි නිර්මාණය කර තිබෙනවා.

ඒ වගේම මහජනතාව අපේක්ෂා කළා අපේ ආණ්ඩුව පාතාලය සහ මත්ද්‍රව්‍ය ජාවාරම විනාශ කරයි කියලා. අපි ආණ්ඩුවක් ලෙස තීරණය කර තිබෙනවා පාතාලය සහ මත්ද්‍රව්‍ය ව්‍යසනය අපේ රටින් මුළුමනින්ම ඉවත් කිරීමට. පාතාල නායකයෝ විශාල ප්‍රමාණයක් ගෙනැල්ලා තියෙනවා. නඩු විභාගයට ලක්කරලා තියෙනවා. අපි මේ මත්ද්‍රව්‍ය ජාවාරම එක්ක හැප්පෙනවා. අපි ඒක කරනවා. පහුගිය කාලයේ ලෝකයේ ඇතිවුණු විවිධ ගැටලු, විවිධ අවස්ථාවලදී අපි ගත්තු ඒ හැම තීන්දුවක්ම ජාත්‍යන්තර වශයෙන් සැම දෙනාගේම ප්‍රසාදයට ලක්වෙන ආකාරයටම අපි තීන්දු අරන් තියෙනවා. මෑත දශක දෙක-තුනක කාලය තුළ ඉතාමත් හොඳ, ශක්තිමත්, ගෞරවයේ විශ්වාසය තහවුරු වෙන ජාත්‍යන්තර සබඳතාවල ඉතාමත් හොඳ ගුණාත්මක අදියරක් අපේ ආණ්ඩුව තියලා තියෙනවා.

මෙරට ආර්ථිකයේ විශාල ජයග්‍රහණය රැසක් අපි පසුගිය වසර දෙක තුළ ලබාගෙන තිබෙනවා. රටේ ආර්ථිකයේ වැදගත් අවස්ථාවකට අපි මේ වන විට පැමිණ තිබෙනවා. මේ අවුරුදු දෙක තමයි ලංකාවේ වැදගත් ආර්ථික දත්තවල වැදගත් දර්ශක පෙන්වපු යුගය. අප්‍රේල් මාසයටත් වඩා සමහර තැන්වල ඉන්ධන මිල ඉහළ ගොස් තිබෙනවා. දැන් ඒ මුළු බර ජනතාවට දුන්නොත් විශාල අගයකින් ඉන්ධන මිල ඉහළ යනවා. ලෝක වෙළෙඳපොළේ යුද ගැටුම නිසා ඉන්ධන මිලේ විශාල ඉහළ යාමක් තිබෙනවා. ඒ නිසා අපි තීරණය කර තිබෙනවා ජනතාවට විශාල බරක් නොදෙමින් ඉදිරි මාස 03ට නැවත ඉන්ධන සහනාධාරයක් ලබා දීමට. එහෙම ආණ්ඩු ලංකාවේ තිබිලා නැහැ.

ආර්ථික දත්ත ඉහළ යාමට වඩා ජනතාවගේ ජීවිත පහසු කිරීම වැදගත් වෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ඉඩම් කච්චේරි වැනි රාජ්‍ය ආයතන ගණනාවක් ලබන වසරේ සිට ගෙදර සිටම වැඩ කටයුතු කරගත හැකි වන පරිදි ඩිජිටල්කරණය කර ජනතාවගේ කාලය සහ මුදල් ඉතිරි කිරීමට සැලසුම් කර තිබෙනවා. අපේ සැලැස්ම වන්නේ ජනතාව සහ ආණ්ඩුව අතර ඉතාමත් හොඳ සම්බන්ධතාවයක් ඇති කර ගැනීමයි. ජනතාව සහ ආණ්ඩුව අතර විශ්වාසවන්ත සහයෝගිතාවයක්, ජනතාව සහ ආණ්ඩුව අතර ශක්තිමත් සබඳතාවයක් තමයි මේ රට සංවර්ධනයට ගෙනියන්නේ, ඒ වෙනුවෙන් අපි හැමදෙනාම එකතු වෙමුයි කියලා ආරාධනා කරනවා.

## විසඳුම් වෙනුවෙන්...

3 පිටුවෙන්..

ආරක්ෂා කිරීම කියන්නේ කඳු කිහිපයක් හෝ වනාන්තර කිහිපයක් ආරක්ෂා කිරීමක් පමණක් නොවෙයි. එය රටේ ජල ආරක්ෂාවත්, කෘෂිකර්මාන්තයත්, ජන ජීවිතයත් සමඟ සෘජුව සම්බන්ධයි.

අද මධ්‍ය කඳුකරය සම්බන්ධයෙන් විවිධ ආයතනවලට විවිධ වගකීම් තිබෙනවා. ඒ වගකීම් එකිනෙකින් වෙන්ව ක්‍රියාත්මක වුණොත් දිගුකාලීන ප්‍රතිඵලයක් ලබාගැනීම අපහසුයි.

ඒ නිසා විවිධ ආයතනවල කටයුතු එකම රාමුවක් තුළට ගෙන එමින්, මධ්‍ය කඳුකරය සඳහා දිගුකාලීන කළමනාකරණ වැඩපිළිවෙළක් සකස් කිරීම අවශ්‍යයි. විශේෂ ආයතනයක් හරහා සිදු කිරීමට බලාපොරොත්තු වන්නේ එම සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සහ මධ්‍ය කඳුකරයේ වනාන්තර, ජල පෝෂක ප්‍රදේශ, ජෛව විවිධත්වය හා සමස්ත පරිසර පද්ධතිය දිගුකාලීනව ආරක්ෂා කිරීමයි.

මධ්‍ය කඳුකරය රැකගැනීම කියන්නේ මධ්‍ය කඳුකරයේ ජනතාව වෙනුවෙන් පමණක් කරන කාර්යයක් නොවෙයි. එය මුළු රටේම අනාගතය වෙනුවෙන් කරන ආයෝජනයක්.

***කොළඹ වෙරළ තීරයේ අනවසර හෝටල් ප්‍රමාණයක් ඉවත් කරන බව පසුගියදා ප්‍රකාශ වුණා. එවැනි පියවරකට යන්න සිදු වුණේ ඇයි?***

වෙරළ කියන්නේ කෙනෙකුට පෞද්ගලිකව අයිති කරගන්න පුළුවන් දෙයක් නොවෙයි. එය පොදු සම්පතක්. ඒ නිසා වෙරළ කලාපයේ සිදු කරන ඕනෑම ඉදිකිරීමක් පරිසරයට වගේම මහජන අයිතියටත් බලපානවා.

අපි සංචාරක ව්‍යාපාරයට විරුද්ධ නැහැ. රටේ ආර්ථිකයට සංචාරක කර්මාන්තය වැදගත්. නමුත් සංචාරක කර්මාන්තය දියුණු කිරීම කියන්නේ වෙරළ පරිසරය විනාශ කරමින් හෝ නීතිය උල්ලංඝනය කරමින් හෝටල් ඉදිකිරීමට අවසර දීම නොවෙයි.

හෝටලයක් හෝ වෙනත් ඉදිකිරීමක් සිදු කරන විට අදාළ නීති, පාරිසරික රෙගුලාසි සහ වෙරළ සංරක්ෂණ අවශ්‍යතා සියල්ල සැලකිල්ලට ගත යුතුයි. අනවසර ඉදිකිරීම් නිසා වෙරළ ඛාදනය වැඩි විය හැකියි. වෙරළ පරිසර පද්ධතිවලට හානි විය හැකියි. ඒ වගේම මහජනතාවට වෙරළට ඇති ප්‍රවේශය සීමා විය හැකියි.

ඒ නිසා නීතියට පටහැණි ඉදිකිරීම් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම අවශ්‍යයි. මෙය කිසියම් පුද්ගලයෙකුට හෝ ව්‍යාපාරයකට එරෙහිව කරන ක්‍රියාමාර්ගයක් ලෙස නොවෙයි අපි දකින්නේ. මෙය පොදු සම්පතක් වන වෙරළ සහ එහි පරිසර පද්ධතිය අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කිරීමේ වගකීමක්.

ඔබ කියන අනවසර ඉදිකිරීම්, මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම සහ පාතාලය සමගත් සම්බන්ධ බවට හෙළිදරව් වෙලා තිබෙනවා. අපට සංවර්ධනය අවශ්‍යයි. සංචාරක ව්‍යාපාරයත් අවශ්‍යයි. නමුත් අපට අවශ්‍ය සංවර්ධනය වන්නේ අද ලාභයක් ලබාගෙන හෙට පරිසරය විනාශ කරන සංවර්ධනයක් නොවෙයි. පරිසරය ආරක්ෂා කරමින්, නීතියට අනුකූලව, අනාගත පරපුරටත් භාවිත කළ හැකි තිරසර සංවර්ධනයක්.

## රතු මුහුදට...

6 පිටුවෙන්..

තොරව සුඩානය විසින් සාමය උදාකරගත යුතු බවයි. සුඩානය තුළ වේගයෙන් ඉහළ යමින් තිබූ චීන ආයෝජන තවදුරටත් වර්ධනය කරගත හැකි සාමකාමී වටපිටාවක් නිර්මාණය කරගැනීම ඔවුන්ගේ බලාපොරොත්තුව වී ඇත. රුසියාව අල්-බුර්හාන් පාලනය සමග සෘජු සබඳතා පවත්වා ගනිමින් පෝර්ට් සුඩාන්හි (රතු මුහුදේ) නාවික හමුදා කඳවුරක් ඉදිකිරීමට ගිවිසුම් අත්සන් කර ඇති අතර රුසියානු 'වැග්නර්' හමුදා RSF සංවිධානයට යුද අවි ලබා දෙන බවටත්, ඔවුන් ඩාෆූර්හි රන් ආකරවල ආයෝජන සිදුකරමින් ඒවා අත්පත් කරගනිමින් සිටින බවටත් බටහිර මාධ්‍ය විසින් චෝදනා එල්ල කර ඇත.

තවමත් ලෝකයේ සෑම රටක්ම නිල වශයෙන් පිළිගනු ලබන්නේ අල්-බුර්හාන් පාලනය වුවත් RSF සංවිධානයට ජාත්‍යන්තර සහය හොර රහසේ හෝ ලැබීමත් සමග මෙම යුද්ධය දිගුකාලීනව පැවතීමේ අවදානමක් පවතී. රතු මුහුදේ බලය සඳහා ලෝක බලවතුන් එය සීතල යුද්ධයක් ලෙස භාවිතා කරන ප්‍රමාණය අනුවද මෙම අවදානම තවදුරටත් වැඩි විය හැක. එසේ වුවහොත් සුඩාන ජනතාව තවදුරටත් පීඩාවට පත්වීම මෙන්ම නැවත වරක් සුඩානය බෙදා වෙන්කිරීම දක්වාද මෙය වර්ධනය වීමේ හැකියාවක් ඇත.

## ශ්‍රී ලංකාව විශාල හදවතක්...

12 පිටුවෙන්..

මාසයේදී, අතිශය අස්ථාවර භූ-දේශපාලනික පසුබිමක් මධ්‍යයේ, ගැටුමට අදාළ පාර්ශ්වයකට අයත් නෞකාවක් අපගේ දේශසීමා ජල තීරය ආසන්නයේදී අනතුරට ලක්ව ඇති බවත්, එහි සිටි නාවිකයන් රැසකගේ ජීවිත අවදානමට ලක්ව ඇති බවත්, අප දැන ගත්තා. විවිධ සංවේදී කරුණු පිළිබඳව ඉතා ප්‍රවේශමෙන් කටයුතු කරමින් සහ අප සතුව තිබූ සීමිත ජාතික සම්පත් උපයෝගී කර ගනිමින්, තුවාල ලැබූවන් සහ රෝගී වූවන් බේරා ගැනීමේ, ඔවුන්ව රැකබලා ගැනීමේ අසීරු කාර්යයක අප නිරත වුණා. එම කාර්යය අභියෝගාත්මක වුවද, අප තවත් සිය ගණනක් දෙනා බේරා ගැනීමට කටයුතු කළා. මිනිස් ජීවිත අනතුරේ පවතින බව දුටු අප, ජාත්‍යන්තර නීතිය සහ මානුෂීයත්වය පදනම් කරගෙන ක්‍රියා කළා, අපගේ මධ්‍යස්ථභාවය ආරක්ෂා කරගන්නා අතරම, අප සියල්ලටම වඩා ඉහළින් මානුෂීයත්වයට මුල් තැන ලබා දුන්නා. ජනාධිපති දිසානායක මැතිතුමා නැවත නැවතත් අවධාරණය කළ පරිදි, "මානුෂීයත්වය ආරක්ෂා කිරීමට අපි කිසිවිටෙකත් පසුබට නොවන්නෙමු. මිනිස් ජීවිත ආරක්ෂා කිරීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග තිබේ නම්, ඕනෑම තත්වයක් යටතේ වුවද ඒවා ගැනීමට අප නොපැකිළෙන්නෙමු."

ලෝකය හමුවේ අප ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන්නේ මෙවැනි ශ්‍රී ලංකාවක්; එනම්, ගැටුම් සහ දැඩි බෙදීම් පවතින අවස්ථාවලදී පවා මනුෂ්‍යත්වයට ඉඩක් පවතින බව විශ්වාස කරන, විශාල හදවතක් ඇති කුඩා දූපත් රාජ්‍යයක්. ලෝකය තුළද එම ගුණාංගයම පිළිබිඹු වනු දැකීමට අප කැමැත්තෙන් පසුවෙනවා. මානුෂීයත්වය විනාශ කිරීමේ හැකියාවට වඩා එය ආරක්ෂා කිරීමේ සහ පෝෂණය කිරීමේ හැකියාව වේගයෙන් වර්ධනය වන ලෝකයක් අපට අවශ්‍යව තිබෙනවා. අප අපේක්ෂා කළ යුත්තේද එවැනි පරිවර්තනයක්. මේ හේතූන් නිසාම, ගාසා තීරයේ සහ අත්පත් කරගත් පලස්තීන භූමි ප්‍රදේශවල පවතින ගැටුම් පිළිබඳව අප කනස්සල්ලට පත්ව සිටිනවා.

මෑත වසරවලදී, ගෝලීය ආරක්ෂක තත්ත්වය සැලකිය යුතු ලෙස පිරිහී තිබෙනවා. මෙතරම් ධනයක් සහ දැනුමක් පවතින ලෝකයක, ඖෂධ හා අධ්‍යාපනය අහිමිව, දරුවන් කුසගින්නෙන් පෙළෙමින් සිටියෙදී, අවි ආයුධ සඳහා විශාල සම්පත් ප්‍රමාණයක් දිගින් දිගටම වැය කිරීම පිළිග ැනීමට අපහසු තත්ත්වයක් වෙනවා. බටහිර ආසියාවේ පවතින ගැටුම් සහ එම කලාපයෙන් ඔබ්බටද ඇති වී ඇති එහි දැඩි බලපෑම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දැඩි කනස්සල්ලට පත්ව සිටිනවා. ජාත්‍යන්තර මානුෂීය නීතිය ඇතුළු ජාත්‍යන්තර නීතිය සියලු පාර්ශ්වයන් විසින් පිළිපැදිය යුතු අතර, එයට ගරු කළ යුතු වෙනවා. ගැටුම් නිරාකරණය සඳහා ඇති එකම ප්‍රායෝගික ක්‍රමවේදය සාකච්ඡා මාර්ගය වන අපගේ ස්ථාවරය අප නැවත තහවුරු කරනවා.

ස්වයං -නිර්ණ අයිතිය ඇතුළු පලස්තීන ජනතාවගේ අහිමි කළ නොහැකි අයිතිවාසිකම් වෙනුවෙන් ශ්‍රී ලංකාව අඛණ්ඩව පෙනී සිටිනවා. 1980 දශකයේදී පලස්තීනය වෙනම රාජ්‍යයක් ලෙස පළමුවෙන්ම පිළිගත් රටවල් අතරට ශ්‍රී ලංකාව ද අයත් වෙනවා. 1967 පෙර පැවති දේශසීමා තුළ, ඊශ්‍රායලය සමඟ සාමකාමීව සහ සහජීවනයෙන් කටයුතු කරන ස්වාධීන සහ ස්වෛරී පලස්තීන රාජ්‍යයක් වෙනුවෙන් පෙනී සිටින ජාත්‍යන්තර ප්‍රජාව සමඟ අප එක් වෙනවා.

ගාසා තීරයේ සටන් විරාමයක් පිළිබඳ ආරක්ෂක මණ්ඩලයේ යෝජනාව අප සාදරයෙන් පිළිගන්නා අතර, එය ක්‍රියාත්මක කරන ලෙස සියලු පාර්ශ්වයන්ගෙන් ඉල්ලා සිටිනවා. කිසිදු බාධාවකින් තොරව සිවිල් වැසියන් වෙත මානුෂීය ආධාර ළඟා විය යුතු බව අප විශ්වාස කරනවා, ගාසා තීරය යථා තත්වයට පත් කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම හදිසි ප්‍රමුඛතාවක් විය යුතු වෙනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




තලංගම මෙට්‍රො බස් ඩිපෝ පරිශ්‍රයේදී තවත් මෙට්‍රෝ බස් රථ 112ක් ධාවනයට එක් කිරීමේ අවස්ථාවට එක් වී




ජවිපෙ ලේකම් භාරතීය ජනතා පක්ෂයේ ජාතික මහලේකම් ශ්‍රී බී. එල්. සන්තෝෂ් මහතා හමුවී



කඩුවෙල, රනාල, බටේවෙල අභිනවයෙන් ඉදිකෙරෙන 'පියවර' පෙර පාසල සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා මුල්ගල තබමින්



රට පුරා සිදුකරන Youth Summit වැඩසටහනේ කොළොන්නාව Youth Summit පිහිටුවීම



ඌවපරණගම අලගොල්ලේ නායයෑමේ අධි අවදානම් කලාපයේ ජීවත් වූ පවුල් 51කට නව නිවාස සඳහා මුල්ගල් තබමින්

# ශ්‍රී ලංකාව විශාල හදවතක් ඇති කුඩා දූපත් රාජ්‍යයක්

## විදේශ කටයුතු හා සංචාරක ප්‍රවර්ධන අමාත්‍ය විජිත හේරත් සහෝදරයා

(එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 81වැනි සැසිවාරය අමතා සැප්තැම්බර් 28 වැනි දින කළ කථාවේ සංක්ෂිප්ත සටහන)



ශ්‍රී ලංකාවේ මෑතකාලීන ඉතිහාසයේ සිදුවූ දරුණුතම ස්වභාවික ආපදා අතුරින් එකක් වූ දිට්වා කුණාටුව, අප රට පුරා දැඩි විනාශයක් සිදු කළා. මෙම ආපදාව හේතුවෙන් සිය ගණනක් ජීවිත අහිමි වූ අතර, මිලියන දෙකකට අධික ජනතාවක් ඉන් පීඩා වින්දා. එමගින්, ජනතාවගේ ජීවනෝපායන්ට බාධා එල්ල වූ අතර, අත්‍යවශ්‍ය යටිතල පහසුකම්ද විනාශ වුණා. එම වේදනාවකය අත්විඳ ඇති අප, හිමාලයානු ගංවතුර හේතුවෙන් නේපාලයේ සහ චීනයේ ජනතාවට එල්ල වූ අභියෝගය පැහැදිලිව වටහා ගත්තා. එහි වින්දිතයින්ට අපගේ ශෝකය පළ කිරීමට මා මෙම අවස්ථාව යොදා ගන්නවා.

දේශගුණික විපර්යාසවල දැවැන්ත මානව හා ආර්ථික පිරිවැය මෙම ඛේදවාචක සිදුවීම් තුළින් පෙන්නුම් කරනවා. කණගාටුවට කරුණ නම්, ගෝලීය විමෝචනයට අවම වශයෙන් දායක වූ රටවල් විසින් එහි දරුණුතම ප්‍රතිවිපාක විඳිනු ලැබීමයි. දේශගුණික බලපෑම සම්බන්ධ ක්‍රියා මාර්ග සඳහා වන ඉල්ලීම හුදෙක් ක්ෂණික ඉල්ලීමක් නොවේ. එයට දැනටමත් බොහෝ කල් ගත වී තිබෙනවා. දේශගුණික යුක්තිය හදිසි යථාර්ථයක් බවට පත්විය යුතුයි. අපගේ පාර්ශ්වයෙන්, ශ්‍රී ලංකාව, 2030 වන විට සියයට 70 පුනර්ජනනීය බලශක්තිය සහ 2050 වන විට කාබන් උදාසීනත්වය අත්කර ගැනීමේ මාවතට පිවිසෙමින් සිටිනවා.

දශක තුනක් පුරා පැවති දීර්ඝ ගැටුමෙන් අපගේ සියලුම ප්‍රජාවන්ට අතිවිශාල අලාභහානි සහ පීඩා සිදු වුණා. මීට වසර 17කට පෙර අවි ආයුධ සටන නිමා වුවද, එම ගැටුමෙන් ඇති වූ අතිමහත් පීඩාවන් තවමත් ඉතිරිව පවතින අතර, ඒවා සුවපත් කිරීම සඳහා තව බොහෝ දේ කළ යුතුව තිබෙනවා. එවැනි ඛේදවාචකයක් නැවත ඇතිවීම වැළැක්වීමටත්, ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය කරා යන මාවත ඔස්සේ ඉදිරියට ගමන් කිරීමටත්, අප අධිෂ්ඨාන කරගෙන සිටිනවා. මේ සම්බන්ධයෙන්, නොවිසඳී පවතින ගැටලු විසඳීම සඳහා අපගේ රජය, ජාතික නියෝජිතායතන ශක්තිමත් කරමින් සිටිනවා. පසුගිය වසර දෙක පුරාවටම, සියලු ආකාරයේ සහ ස්වරූපවලින් යුත් වර්ගවාදය සහ ආගමික අන්තවාදය ප්‍රතික්ෂේප කිරීමේ ස්ථාවරයේ අප නොසැලී රැඳී සිටිනවා. වඩාත් ආරක්ෂිත, සියලු දෙනා ඇතුළත් වූ, එක්සත් මෙන්ම, විවිධත්වයේ සාරවත් බවින් වඩාත් ශක්තිමත් වූ ජාතියක් ගොඩනැගීම සඳහා අප නොපසුබටව අඛණ්ඩව කටයුතු කරනවා.

ස්වාභාවික ආපදා හේතුවෙන් ඇතිවන ප්‍රතිවිපාකවලට අමතරව, වෙනත් බොහෝ රටවල් මෙන්ම ශ්‍රී ලංකාවද බටහිර ආසියාවේ සහ වෙනත් ප්‍රදේශවල පවතින ගැටුම්වල දරුණු බලපෑමට මුහුණ දෙමින් පිටිනවා. මෙවැනි අභියෝගාත්මක කාල සීමාවන් තුළ පවා, ජාත්‍යන්තර නීතියට අදාළ සිය වගකීම් ඉටු කිරීමටත්, මානව ජීවිතයේ පාරිශුද්ධභාවය සහ මානව ගරුත්වය තහවුරු කිරීමටත් ශ්‍රී ලංකාව අඛණ්ඩව කටයුතු කර තිබීම පිළිබඳව මා සතුටට පත්වෙනවා.

මෙම වසරේ මාර්තු 11 පිටුවට

# බාහිර කම්පනයන් හමුවේ ආර්ථිකය විශිෂ්ට ජයග්‍රහණ ලබා තිබෙනවා

## කම්කරු අමාත්‍ය සහ මුදල් නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත සහෝදරයා



ශ්‍රී ලංකාව ආර්ථිකයට එල්ල වූ කම්පනයන් එකිනෙකට ඔරොත්තු දෙමින් අතිවිශිෂ්ට ආකාරයෙන් ඉදිරියට පැමිණ ඇති බවත් ඒ බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධානීන් විසින් අවධාරණය කර තිබෙන බවත් කම්කරු ඇමති සහ මුදල් නියෝජ්‍ය ඇමති ආචාර්ය අනිල් ජයන්ත සහෝදරයා ප්‍රකාශ කළේය.

ආචාර්ය අනිල් ජයන්ත සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 27වැනි දින මාධ්‍ය වෙත කරන ලද පැහැදිලි කිරීමකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඔහු මෙසේද කියා සිටියේය.

ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීමේ කාර්යයේදී මූලිකවම පැවරී තිබෙන්නේ බංකොලොත් කර තිබූ තැනින් ගොඩ ගැනීමයි. බාහිර සාධකවල බලපෑමට ලක්වන රටේ විදේශ විනිමය සංචිත ගොඩනගා ගැනීම නිසි ආකාරයෙන් කර ගැනීමටත් ගෙවී ගිය වසර දෙක තුළ සමත් වුණා. මේ නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඩොලර් බිලියන 2.4ක වාරික ලබාගෙන තිබෙනවා. තව වාරික දෙකක් ලබා ගැනීමේ සමාලෝචනය සැප්තැම්බර් 10 වැනිදා සිට 23 දින දක්වා සිදු කළා. එය හත්වන සමාලෝචනයේ මූලික වටයේ සාකච්ඡා වාරයයි. මෙම සාකච්ඡා සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නිකුත් කළ නිවේදනය වැරදි ආකාරයෙන් අර්ථකථනය කරමින් ඇතැම් පුද්ගලයන් සහ මාධ්‍ය ආයතන ප්‍රචාර ගෙන යනවා. එම වාර්තා කළ පුද්ගලයන්ගේ මූලික අපේක්ෂාව වී තිබෙන්නේ මූල්‍ය අරමුදල ලංකා රජය කෙරෙහි සෘණාත්මක ප්‍රතිචාර දක්වා ඇති බවටයි. ඔවුන් කළ සෘණාත්මක ප්‍රචාර සියල්ල වැරදි බව ගෙවී ගිය කාලය තුළ ඔප්පු වී තිබෙනවා.

ඒ වගේම ශක්තිමත් ආර්ථික වෘද්ධියක් ඇති බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විශේෂයෙන් අවධාරණය කර තිබෙනවා. කෙටිකාලීනව උද්ධමනයේ සිදුවී තිබෙන බලපෑම ලෝක වෙළඳපොළේ තෙල් මිල වැඩිවීමේ කම්පනයෙන් සිදුවී ඇති බවත් මෙරට බැංකු පද්ධතියත් ලාභදායීව සහ ප්‍රාග්ධනය ශක්තිමත් කර ගෙන ඇති බවත් මූල්‍ය අරමුදල පිළිගන්නවා. මැදපෙරදිග යුද්ධය ඇතුළු ලෝකයේ ඇති වන ආර්ථික කම්පනයන්ගේ ප්‍රතිවිපාක ශ්‍රී ලංකාවට පමණක් නොවෙයි ලෝකයටම බලපාන බව ඔවුන් පෙන්වා දී තිබෙනවා. අපේ ආර්ථිකයේ ස්ථාවරත්වය අත්පත් කර ගැනීමෙන් පසුව වේගයෙන් ඉදිරියට යාම පිළිබඳව වූ සැලසුම් රජයක් ලෙස අපි සකස් කරමින් ජාත්‍යන්තරයත් සමග අවබෝධය ගොඩනගා ගනිමින් සිටින අතර සුළු පිරිසක් නොමග යැවීමේ ප්‍රචාර දියත් කිරීම පිළිබඳව අවබෝධයකින් කටයුතු කරන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටිනවා.

# ජනතාවට කාර්යක්ෂමව සේවය ලබා දීම වෙනුවෙන් සියලු පහසුකම් සලසනවා

## ළමා හා කාන්තා කටයුතු අමාත්‍ය සරෝජා සාවිත්‍රි පෝල්රාජ් සහෝදරිය

ජනතාවට ඉටු කළ යුතු කාර්යභාරය වඩාත් විධිමත්ව හා කාර්යක්ෂමව සම්පූර්ණ කිරීම වෙනුවෙන් නීති වෙනස් කිරීම, යටිතල පහසුකම් යාන්ත්‍රණය සකස් කිරීම සහ ජනතාව වෙත ප්‍රවේශ වීම මූලික කර ගනිමින් නව ප්‍රතිපත්ති සම්පාදනය කර ගත යුතු බවත් ඒ සඳහා පහසුකම් සැලසීමට රජය සෑමවිටම සූදානමින් සිටින බවත් ළමා හා කාන්තා කටයුතු අමාත්‍ය සරෝජා සාවිත්‍රි පෝල්රාජ් සහෝදරිය පැවසීය.

සරෝජා සාවිත්‍රි පෝල්රාජ් සහෝදරිය මේ බව පැවසුවේ පසුගිය සැප්තැම්බර් 24 දින අමාත්‍යාංශයේ ළමා දින සැමරුම සංවිධානය කිරීමේ නිලධාරී හමුවක් අමතමිනි. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ සරෝජා සහෝදරිය මෙසේද පැවසුවාය.

"සර්, කියන හැමදෙයක්ම චක්‍රලේඛයක්" යනුවෙන් හැඳින්වූ යුගය ඉවරයි. ප්‍රතිලාභියා වෙනුවෙන් හිතන්න පුළුවන් හදවතක් හැමකෙනෙකුටම තියෙන්න ඕනෑ. නිලධාරියා හෝ දේශපාලන අධිකාරිය නොවෙයි, ප්‍රමුඛ විය යුත්තේ. සේවය බලාපොරොත්තුවෙන් අපි ළඟට එන අයට වඩා වැඩි පිරිසක් සේවය ලබා ගැනීමට එන්න නොහැකිව මග ඇහිරී ඉන්නවා. සමහර නිලධාරීන් හිතාමතාමත් සේවය ලැබිය යුතු අයව පැත්තකට දමා තිබෙනවා. සේවය අවශ්‍ය ජනතාව වදයක් හෝ කරදරයක් ලෙස කල්පනා කරනවා නම්, එවැනි කිසිවෙකුටත් යහපත් සේවා තෘප්තියක් ලැබෙන්නේ නැහැ. අපි ඉටුකරමින් ඉන්නේ රාජකාරියට එහා ගිය මානුෂීය සේවාවක්.



ගෙදරින් අත්හැරෙන, පාසලෙන් අත්හැරෙන සහ රාජ්‍ය ආයතනික ව්‍යුහයෙන් අත්හැරෙන අපේ දරුවන් සමාජයේදී අපයෝජන සහ අනතුරුවලට ලක්වෙනවා. ඒ ජීවිත සම්බන්ධයෙන් අපට තිබෙන වගකීමෙන් කිසිසේත්ම නිදහස් වෙන්න බැහැ. දරුවන් සම්බන්ධ අවදානමට පෙර හඳුනා ගැනීමත් ඔවුන් ඒ අවදානමෙන් මුදා ගැනීමටත් අදාළ ප්‍රතිපත්ති අපි සම්පාදනය කර තිබෙනවාද? අපි ගන්නා ක්‍රියාමාර්ගවල ප්‍රමාදයක් පවතිනවා නම්, දරුවන්ගේ ජීවිත සම්බන්ධ වගකීම පිළිබඳව දැඩි හැඟීමක් අපි එකිනෙකා තුළ තිබිය යුතුයි. මානුෂීයත්වය වෙනුවෙන් කැපවීමක් නැති ප්‍රතිපත්ති හෝ චක්‍රලේඛ හිස් කඩදාසි විතරයි. ප්‍රතිපත්ති හෝ ක්‍රියාමාර්ග සජීවී වෙන්න නම්, ගොඩනැගුණු යහපත් සමාජයක් අපට පේන්න තියෙන්න ඕනෑ. ඒ සමාජයෙන් පෙරලා රජයේ නිලධාරීන් ඇතුළු අප හැමදෙනාවම රැක ගනීවි. සංවේදී හදවතකින් තම තමන්ගේ රාජකාරියේ වගකීම් ඉටුකිරීමට පෙරට එන ලෙස හැමදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.